# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
# கைத்தொழில் மற்றும் வணிக அமைச்சு
# Ministry of Industry & Commerce



# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த முன்னேற்ற அறிக்கை
# Annual Progress Report

# 2012

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2012

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ටද පරිවර්තනය කර ඇත.

# දැක්ම

***"සවිමත් වාණිජමය පරිසරයක් තුළින් ජාත්‍යන්තර තරඟකාරී දේශීය කර්මාන්ත අංශයක් ශ්‍රී ලංකාව තුළ ගොඩනැගීම"***

# මෙහෙවර

***"ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නංවන්නාවූද, ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදන බිහි කරන්නාවූ, සවිමත් වාණිජ අංශයකින් සමන්විතවූද, ධරණීය හා තරඟකාරීත්වයකින් හෙබි නිෂ්පාදන ආයතනයන්හි අභිවෘද්ධිය සඳහා හිතකාමී වන පරිසරයක් නිර්මාණය කිරීම"***

# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මූලික අභිමතාර්ථයන්................

- දැනුම මත පදනම් වූ නිෂ්පාදන කර්මාන්ත අංශයක් බිහිකිරීම
- අගය එකතු කල අපනයනයන් සංවර්ධනය හා ප්‍රවර්ධනය තුලින් අපනයන ආදායම ඉහල නැංවීම
- හිතකර වාණිජමය පරිසරයක් ඇතිකිරීම

# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂයපථය

2010.11.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට පවරා ඇති විෂයපථය පහත පරිදි වේ.

1. මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කර්මාන්ත හා වාණිජ විෂයන්ට හා සමගාමීව දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම.
2. අදාල අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමඟ එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙය වීම.
3. අමාත්‍යාංශ විෂයපථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.
4. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.
5. බුද්ධිමය දේපල පිළිබඳව ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල කාර්යාලයෙහි (WIPO) ප්‍රකාශන අයිතිය
6. අපනයන සංවර්ධනය හා උපදේශන සේවා
7. ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා
8. විදේශයන්හි ශ්‍රී ලංකා වෙළඳ කටයුතු නියෝජනය
9. තරඟකාරීත්ව පිළිවෙත
10. කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය

# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශ සහ ආයතන

## කර්මාන්ත අංශය

කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය

ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන අංශය

සංවර්ධන අංශ 1

සංවර්ධන අංශ 2

සංවර්ධන අංශ 3

කර්මාන්ත ලියාපදිංචි කිරීමේ සහ කළමනාකරණ තොරතුරු අංශය

ඵලදායිතා වර්ධන අංශය

රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

පේෂකර්මාන්ත සංවර්ධන අංශය

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය

## වාණිජ අංශය

වාණිජ දෙපාර්තමේන්තුව

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# පටුන


| | පිටු අංකය |
|---|---|
| **කර්මාන්ත අංශය** | |
| සාර්ව ප්‍රතිපත්ති අංශය | 01 |
| කර්මාන්ත සංවර්ධන අංශය | 02 |
| සංවර්ධන අංශ 1 | 07 |
| සංවර්ධන අංශ 2 | 09 |
| සංවර්ධන අංශ 3 | 10 |
| කර්මාන්ත ලියාපදිංචි කිරීමේ සහ කළමනාකරණ තොරතුරු අංශය | 12 |
| ඵලදායිතා වර්ධන අංශය | 14 |
| රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය | 15 |
| සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය | 17 |
| කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් | 19 |
| මාන්තායි සෝල්ට් ලිමිටඩ් | 21 |
| ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 22 |
| පේෂකර්මාන්ත සංවර්ධන අංශය | 23 |
| පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 26 |
| ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය | 28 |
| **වාණිජ අංශය** | |
| වාණිජ දෙපාර්තමේන්තුව | 29 |
| සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 31 |
| ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය | 32 |
| ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | 34 |
| **අමාත්‍යාංශයේ පොදු තොරතුරු** | 37 |
| **මූල්‍ය ප්‍රගතිය** | 40 |

# පෙරවදන

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2012 වාර්ෂික කාර්යසාධන වාර්තාව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 මගින් දෙන ලද උපදෙස් අනුව පිළියෙල කර ඇත.

මෙම වාර්තාවේ මුල් කොටසින් අමාත්‍යාංශයේ කර්මාන්ත අංශය යටතේ ඇති ආයතන සහ අංශ වලින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල කාර්යසාධනය පිළිබඳව විස්තර කර ඇත. අමාත්‍යාංශයේ, වාණිජ අංශය යටතේ ඇති ආයතන වලින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල කාර්ය සාධනය මෙම වාර්තාවේ දෙවෙනි කොටසින් දක්වා ඇත.

අමාත්‍යාංශයේ පොදු තොරතුරු සහ 2012 වර්ෂයේ සමස්ත මූල්‍ය කාර්යසාධනය අවසන් වශයෙන් සවිස්තරාත්මකව දක්වා ඇත.

# කර්මාන්ත අංශය

# කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය

### හැඳින්වීම

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සාර්ව ප්‍රතිපත්ති අංශය කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන පරිදි වෙළඳ හා තීරු බදු සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට දායක වේ.

### ජාත්‍යන්තර වෙළඳාම හා ආශ්‍රිත කටයුතු

නිදහස් වෙළඳ ගිවිසුම් තුලින් අපනයන උත්පාදන කර්මාන්ත සඳහා අපනයන අවස්ථා ලබා ගැනීමට දායක වීම හැරුණුකොට, දේශීය කර්මාන්තයන් හි සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා පියවර ගැනීම ද සාර්ව ප්‍රතිපත්ති අංශය විසින් වාණිජ දෙපාර්තමේන්තුව හා එක්ව සිදුකරනු ලැබේ.

### තීරු බදු ආශ්‍රිත කටයුතු

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, රාජ්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික කවුන්සිලය හා රේගු දෙපාර්තමේන්තුව ආදියෙහි අදාල නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය තුලින් දේශීය කර්මාන්තකරුවන්ගේ තීරුබදු ආශ්‍රිත ගැටළු විසඳීම සඳහා මෙම අංශය සිය දායකත්වය දක්වයි.

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා සාර්ව ආර්ථික ප්‍රතිපත්ති අංශය විසින් ගෙන ඇති පියවර

පහත සඳහන් පියවරයන් නිර්දේශ කිරීම මඟින් කර්මාන්තකරුවන්ගේ තීරුබදු ආශ්‍රිත ගැටළු විසඳීමට සාර්ව ප්‍රතිපත්ති අංශය දායක වී ඇත.

- අමුද්‍රව්‍ය, අතරමැදි යෙදවුම් සහ යන්ත්‍රෝපකරණ වල තීරුබදු හා සෙස් බදු නිදහස් කිරීම හෝ අඩු කිරීම.
- දේශීය කර්මාන්ත සුරක්ෂිත කිරීම සඳහා සුදුසු වන පරිදී තිරු බදු හා සෙස් බදු පැනවීම ඉහල නැංවීම හෝ සංශෝධනය කිරීම.
- දේශීය කර්මාන්තයන් සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍යවල පවතින හිඟතාවයන් සැලකිල්ලට ගෙන අගය එකතු නොකරන අමුද්‍රව්‍ය ආකාරයෙන් භාණ්ඩ අපනයනය කිරීම අවම කිරීම/ වැලැක්වීම සඳහා අපනයන සෙස් බද්දක් රජය විසින් හඳුන්වා දීම.

### දේශීය කර්මාන්ත වල අගය එකතු කිරීම දිරිමත් කිරීම

30% කට වඩා දේශීය එකතු කල අගයක් සහිත දේශීයව එකලස් කල/නිෂ්පාදිත මෝටර් වාහන සහ විදුලි උපකරණ, කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශයන් මත නිෂ්පාදන බද්දෙන් නිදහස් කල හැකිය. මේ සඳහා අවශ්‍ය නිර්ණායකයන් සැකසීම, අදාල ගණනය කිරීම් සිදුකිරීම ලේඛන හා නිෂ්පාදන කර්මාන්ත නිරීක්ෂණය සහ අවශ්‍ය මග පෙන්වීම් සිදු කිරීම සාර්ව ප්‍රතිපත්ති අංශය මඟින් සිදු කරනු ලැබේ. ඒ අනුව දේශීයව අගය එකතු කරන ලද වාහන සඳහා 2008 දී මුල් වරට නිෂ්පාදන බදු සහනය ලබාදීමෙන් පසු 2012 වසර අවසන් වන විට ඒ සඳහා වාහන නිෂ්පාදන සමාගම් 07ක් දේශීයව අගය එකතු කල වාහන එකලස් කිරීම සඳහා අවතීර්ණ වී ඇති අතර 30% කට වඩා දේශීය අගය එකතු කල වාහන 4000 කට වඩා නිෂ්පාදනය කර ඇත.

මීට අමතරව දේශීය නිෂ්පාදන ආයතනයක් විසින් දේශීයව එකතු කළ අගයක් සහිතව නිෂ්පාදනය කරන ලද රෙදි සෝදන යන්ත්‍ර, ශීතකරන සහ බෝතල් සිසිල් කිරිමේ යන්ත්‍ර නිෂ්පාදනය කරනු ලබන සමාගම් දෙකක් සඳහා ද මෙම බදු සහන ලබා දී ඇත.

# ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන අංශය

## හැඳින්වීම

සංවර්ධිත ප්‍රදේශවලට පමණක් සීමා වී ඇති කාර්මික සංවර්ධනය ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාප්ත කිරීමටත් එමඟින් ජාතික ආදායමට කර්මාන්ත අංශයෙන් වන දායකත්වය ඉහල නැංවීමටත් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශයේ ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන අංශය දායක වෙයි. මෙම කර්තව්‍යයේ දී ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයෝජන දිරිගැන්වීම, අවශ්‍ය වන යටිතල පහසුකම් සලසා දීම සහ තාක්ෂණික පහසුකම් හා උපදේශන සේවා ලබාදීම මෙම අංශයේ වගකීම වේ.

## ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත යටතේ සෑම පළාතක් සඳහාම ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු ස්ථාපිත කර ඇත.මෙම කමිටුවේ කාර්යභාරය ලෙස පළාත් තුල කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වන සැලසුම් සහ ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය වන පහසුකම් සැලසීම සහ කර්මාන්ත සම්බන්ධ ආයෝජන තීරණයන් ක්‍රියාත්මක කිරීමට ආයෝජකයන්ට සහය වීම හැඳින්විය හැක.

## ප්‍රාදේශීය කර්මාන්තපුර

මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය කර්මාන්තපුර වැඩසටහන ඉතා වැදගත් වැඩසටහනකි. මෙම වැඩසටහන මගින් කර්මාන්ත හිමියන් විසින් භූමිය, විදුලිබලය, ජලය වැනි පොදු පහසුකම් සඳහා දැරිය යුතු ආයෝජනය අවම කරනු ලබයි. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා අමාත්‍යංශය මගින් රට පුරා කර්මාන්තපුර 26ක් දිස්ත්‍රික්ක 16ක් තුල ස්ථාපනය කර ඇත.

## 2012.12.31 දිනට ප්‍රගතිය

2012 වසර අවසන් වන විට විදුලිය, ජලය හා මාර්ග පද්ධතිය ආදී අවශ්‍ය යටිතල පහසුකම් සහිතව අක්කර 863.5ක ප්‍රමාණයක් සංවර්ධනය කර තිබේ. කර්මාන්ත 277ක් වාණිජ නිෂ්පාදන කටයුතුවල නිරත වන අතර තවත් කර්මාන්ත 48ක් ගොඩනැඟිලි ඉදිකරමින් පවතී. මෙම කර්මාන්තපුරවල රැකියා අවස්ථා 15,182ක් බිහි කර ඇත.

2012 වර්ෂයේ, කර්මාන්තපුරවලින් ඉඩම් කොටස් ලබා ගැනීම සඳහා නව ව්‍යාපෘති සඳහා අයදුම්පත් 106ක් ලැබී ඇති අතර ඒවා අතුරින් ව්‍යාපෘති 74ක් ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු මඟින් අනුමත කර ඇත. එම ව්‍යාපෘති අතුරින් අමාත්‍යංශ ඇගයීමේ කමිටුව විසින් නිර්දේශ කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 65කි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා මෙම වසරේ ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති 65 සඳහා අනුමැතිය ලැබී ඇති අතර ඒ සඳහා ඉඩම් කොටස් වෙන් කර දී ඇත. 2012 වර්ෂය තුල දී නව කර්මාන්ත 30ක් වාණිජ නිෂ්පාදන කටයුතු අරඹා ඇති අතර බිහි වී ඇති නව රැකියා අවස්ථා ප්‍රමාණය 2054කි.

## මතුගම කර්මාන්තපුරය

මතුගම කර්මාන්තපුරය - අදියර I හි සංවර්ධන කටයුතු නිමකර ඇති අතර මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත සඳහා ඉඩම් වෙන් කර ඇත.

ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු නිෂ්පාදන කර්මාන්තයක් තම වාණිජ නිෂ්පාදන කටයුතුවල නිරත වන අතර තවත් කර්මාන්තශාලා 02ක් ඉදිකිරීම් කටයුතුවල නිරත වේ.

අදියර II හි ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමාණපත්‍ර (BOQ), අනුමැතිය සඳහා ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යංශය යටතේ ඇති ස්ථාවර තාක්ෂණික කමිටුව (STC) වෙත යොමු කර ඇත.

## ත්‍රිකුණාමලය කර්මාන්තපුරය

"නැගෙනහිර නවෝදය" වැඩසටහනට සමගාමීව ත්‍රිකුණාමලය කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු

ආරම්භ කරමින් අදියර - I හි අක්කර 25ක සංවර්ධන කටයුතු නිමකල අතර ඒ සඳහා කර්මාන්ත ආයතන 13ක් තෝරා ගෙන ඇත. සේවකයන් 350ක් පමණ සේවයේ යොදවමින් කර්මාන්ත ආයතන 3ක් වාණිජ නිෂ්පාදන කටයුතු අරඹා ඇති අතර සෙසු ආයෝජකයන් කර්මාන්තශාලා ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතුවල නිරත වෙමින් සිටී.
අදියර II හි සංවර්ධන කටයුතු අරඹා තිබූ අතර භූමිය සංවර්ධන හා කාර්යාල ඉදිකිරීම් කටයුතු සඳහා 2012 වර්ෂයේ දී රු. මිලියන 27.13ක් වැය කර ඇත.

### මන්නාරම කර්මාන්තපුරය

"උතුරු වසන්තය" වැඩසටහනට සමගාමීව සංවර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කරනු ලැබූ පළමු කර්මාන්තපුරය ලෙස, මන්නාරම කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු මන්නාරම දූපතෙහි අක්කර 25ක ඉඩමක ආරම්භ කරන ලදී.

භූමිය එළිපෙහෙළි කිරීම හා පිරවීමේ කටයුතු සහ ආරක්ෂිත වැටේ ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇති අතර අභ්‍යන්තර මාර්ග පද්ධතිය,කාණු පද්ධතියේ ඉදිකිරීම් කටයුතු 75%ක් අවසන් කර ඇත. මේ සඳහා 2012 වර්ෂය තුල දී රු.මිලියන 26.24ක් වැයකර ඇත. ජලය සැපයුම සඳහා රු.මිලියන 30.9ක් වැයකර ඇති අතර එහි ඉදිකිරීම් කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත.

අධි සැර (HT Line) අඩු සැර (LT Line) විදුලි සැපයුම් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ඇස්තමේන්තු කැඳවා ඇත.

ආයෝජන මණ්ඩලය මඟින් අනුමත නවීන තාක්ෂණයෙන් යුතු ඇඟලුම් කර්මාන්තශාලා 02ක් සඳහා මෙම වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර එම කර්මාන්තශාලා ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතු අවසන් කර සුළු වශයෙන් වාණිජ නිෂ්පාදන කටයුතු අරඹා ඇත. මේ යටතේ රැකියා අවස්ථා 2500ක් ලබා දීමට නියමිතය.

### ඖෂධ නිෂ්පාදකයින් සඳහා විශේෂ වූ කර්මාන්තපුරය

දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ඖෂධ නිෂ්පාදන හා ඒ ආශ්‍රිත කර්මාන්ත සඳහා වෙන්කල කර්මාන්ත කලාපයක් ස්ථාපිත කිරීමට අමාත්‍යාංශය තීරණය කර ඇත. ඒ සඳහා අක්කර 48ක භූමි ප්‍රමාණයකින් යුත් ඉඩමක් හඳුනාගෙන ඇත.

ඖෂධ හා වෛද්‍ය උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා, යෝජිත කර්මාන්තපුරය සැලසුම් කිරීම අරමුණ වේ. 2012 වර්ෂයේ දී මේ සඳහා රු.මිලියන 0.084ක් වැය කර ඇත.

### වව්නියාව කර්මාන්තපුරය

"උතුරු වසන්තය" වැඩසටහනට සමගාමීව ස්ථාපනය කිරීමට යෝජිත කර්මාන්තපුර තුනෙන් දෙවැන්න, වව්නියාව කර්මාන්තපුරය වේ.
ඕමන්ත ප්‍රදේශයේ කර්මාන්තපුරය සඳහා හඳුනාගත් ඉඩමෙන් අක්කර 24ක් සංවර්ධනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් දැනටමත් අනුමැතිය ලබා දී ඇත. භූගත ජල මූලාශ්‍ර මඟින් කර්මාන්ත සඳහා අවශ්‍ය ජලය ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව ශක්‍යතා අධ්‍යනයක් සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත භාර දී ඇති අතර මේ සඳහා රු.මිලියන 2.12ක් වැය කර ඇත.

### උලපනේ කර්මාන්තපුරය

උලපනේ කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ග ජාලය ඉදිකිරීම නිමකර ඇති අතර එහි අතිරේක ට්‍රාන්ස්ෆෝමරය ද සවි කර ඇත. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2012 වර්ෂයේ දරන ලද වියදම රු.මිලියන 3.2 කි.

මෙම කර්මාන්තපුරය සඳහා මෙම වර්ෂයේ ව්‍යාපෘති 4ක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර කර්මාන්ත දෙකක ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී.

### ලක්ෂ උයන කර්මාන්තපුරය

ලක්ෂඋයන කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ග වැඩි දියුණු කිරීමට ඇස්තමේන්තු කැඳවා ඇත. තවද 2012 වර්ෂයේ කර්මාන්තපුරයේ ජල සැපයුම සඳහා රු.මිලියන 0.6 වැය කර ඇත.

මෙම වසරේදී ආයෝජකයන් 04දෙනෙක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර අයෝජකයන් දෙදෙනෙක් ඉදිකිරීම් කටයුතු අවසන් කර වාණිජ නිෂ්පාදන කටයුතු අරඹා ඇත.

### නවගම්පුර කර්මාන්තපුරය

නවගම්පුර කර්මාන්තපුරයේ ගේට්ටුව ,වැට හා පරිපාලන ගොඩනැඟිල්ල ඉදිකිරීම, නැගෙනහිර පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇති අතර ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී. මේ සඳහා වර්ෂය තුල දී රු. මිලියන 4.9ක දරා ඇත.

කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ග ජාලය ඉදිකිරීමේ ප්‍රමාණපත්‍ර (BOQ) අනුමැතිය සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙත යොමු කර ඇත. මීට අමතරව කර්මාන්තශාලා සඳහා ගොඩනැඟිලි 3ක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර මේ සඳහා කොන්ත්‍රාත්කරුවකු හඳුනාගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.

### ටෙම්පල්බර්ග් කර්මාන්තපුරය

2012 වර්ෂයේ කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඇතුළු පහසුකම් සංවර්ධනය සඳහා රු.මිලියන 12.51ක් වැය කර ඇත. වර්ෂය තුල දී ආයෝජකයන් දෙදෙනෙක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එම ආයොජකයන් දෙදෙනා ද ඇතුළුව 2012 වර්ෂය තුළ වාණිජ නිෂ්පාදන අරම්භ කරන ලද කර්මාන්ත සංඛ්‍යාව 09කි.

### දංකොටුව කර්මාන්තපුරය

දංකොටුව කර්මාන්තපුරයේ ජලාපවාහන පද්ධතියේ වැඩකටයුතු සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට භාර දී භාර දී ඇති අතර රු.මිලියනයක් මේ සඳහා වැය කර ඇත.

### ගලිගමුව කර්මාන්තපුරය

ගලිගමුව කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය මූලික වැඩ කටයුතු නිමකර ඇති අතර මෙ සඳහා 2012 වර්ෂයේ දී රු.මිලියන 0.69ක් වැය කර ඇත.

වර්ෂය තුල දී ආයෝජකයන් 04 දෙනෙක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ඒ අතුරින් ආයෝජකයන් තුන්දෙනෙකු වාණිජ නිෂ්පාදන කටයුතු අරඹා ඇත.

### මාකඳුර (නැගෙනහිර) කර්මාන්තපුරය

මාකඳුර(නැගෙනහිර) කර්මාන්තපුරයේ ජලාපවාහන පද්ධතියේ ඉදිකිරීම් කටයුතු වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර එහි ඉදිකිරීම් කටයුතු 95%ක් පමණ අවසන් කර ඇත. මේ සඳහා රු. මිලියන 8.73ක මුදලක් වැය කර ඇත.

### මාතලේ-නාලන්ද කර්මාන්තපුරය

මාතලේ (නාලන්ද) කර්මාන්තපුරයේ මායිම් තාප්පය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් හඳුනාගැනීමේ කටයුතු ආරම්භ කර ඇති අතර කර්මාන්තපුරය සඳහා රු.මිලියන 2.5ක වියදමින් අතිරේක ට්‍රාන්ස්ෆෝමරයක් සවි කර ඇත.

### මහර කර්මාන්තපුරය

මහර කර්මාන්තපුරයේ පිවිසුම් මාර්ගයේ ඉතිරි කොටස ඉදිකිරීම සඳහා බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් නව ඇස්තමේන්තුවක් කැඳවූ අතර ඒ අනුව සංවර්ධන කටයුතු ඇරඹීම සඳහා රු.මිලියන 12.73ක මුදලක් මෙම වර්ෂයේ දී ගෙවා ඇත.


### කරන්දෙණිය කර්මාන්තපුරය

කරන්දෙණිය කර්මාන්තපුරයේ වීදි පහන් අලුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 0.16ක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවා ඇත.

**මාදම්පේ කර්මාන්තපුරය**

මාදම්පේ කර්මාන්තපුරයේ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සකස් කර අවසන් කර ඇති නමුත් මෙම ඉඩම අමාත්‍යාංශය වෙත පවරා දීය නොහැකි බවට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් දැනුම් දී ඇත.

# අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කර්මාන්තපුර



# සංවර්ධන අංශ - 1

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව ඇති කර්මාන්ත අතුරින් අප ආර්ථිකයට වඩාත් වාසිදායක වන කර්මාන්ත අංශ හඳුනාගෙන එම අංශ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අමාත්‍යාංශය තුල පිහිටුවා ඇති සංවර්ධන අංශ තුනෙන්, මෙම අංශය මූලික වශයෙන් කෘෂිකාර්මික අමුද්‍රව්‍යය යොදාගෙන කෙරෙන කර්මාන්ත සඳහා පිහිටුවා ඇත.

මේ යටතේ පවතින කර්මාන්ත අංශ වනුයේ, අගය එකතු කල තේ, අගය එකතු කල කොහු ආශ්‍රිත නිෂ්පාදන, සැකසූ ආහාර, ඇසුරුම් ද්‍රව්‍යය සහ කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන ආදියයි.

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### සැකසූ ආහාර අංශය

ජාතික පෝෂණ මාසය ඉලක්ක කරගෙන ආහාර සැකසුම් කර්මාන්ත සඳහා ආහාර වල සෞඛ්‍යය ආරක්ෂිත භාවය, ආහාර විවිධාංගීකරණය සහ නව පරපුරේ ආහාර, යොවුන් පෝෂණය සහ ආහාර පුරුදුවල වෙනස්වීම් සහ ආහාර වෙළෙඳපොලෙහි ගෝලීය ප්‍රවණතා යන කරුණු තේමා කොටගෙන දැනුවත් කිරීම් සහ සම්මන්ත්‍රණයන් පැවැත්වුණි.

වාර්ෂිකව පවත්වනු ලබන සැකසූ ආහාර සහ ඇසුරුම් ජාත්‍යන්තර ප්‍රදර්ශනය මෙවර 11 වන වරට ඉතා සාර්ථකව 2012 ජූලි මසදී පවත්වන ලදී. ඒ සඳහා චීනය, ඉන්දියාව, පාකිස්තානය, තායිලන්තය වැනි විදේශීය රටවල් ද, ප්‍රධාන පෙළේ දේශීය කර්මාන්ත 252 ක්ද සහභාගී විය.

සැකසූ ආහාර අංශය සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම යටතේ පෝෂණ මාසය අළලා කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ විශේෂ වැඩමුළු කිහිපයක් සංවිධානය කරන ලදී.

අගය එකතු කර අපනයනය කිරීම සඳහා ලබාදෙන තීරුබදු සහන ක්‍රමය (TIEP) යටතේ සැකසූ ආහාර නිෂ්පාදන කර්මාන්ත 110 ක වටිනාකම් එකතු කල නිෂ්පාදනයන්ගේ අපනයන ධෛර්යමත් කිරීමට පහසුකම් සපයන ලදී.

### තේ කර්මාන්ත අංශය

තේ වල අගය එකතු කිරීම ප්‍රධාන වශයෙන් සිදු වන්නේ ඇසුරුම්කරණය සහ රසකාරක, විවිධාකාර ශාකසාර හා පළතුරු කොටස් එකතුකිරීම තුලිනි. කර්මාන්තය සඳහා අවශ්‍ය මෙම ද්‍රව්‍යය, යන්ත්‍ර සූත්‍ර හා තාක්ෂණය බදු රහිත පදනම යටතේ ආනයනය කිරීමට පහසුකම් සැලසීම මගින් මෙම කර්මාන්තය දිරි ගන්වනු ලැබේ. මෙම වර්ෂයේ දී නව තේ කර්මාන්ත 05ක්ද ඇතුළුව කර්මාන්ත 171 ක් සඳහා මෙම පහසුකම් ලබා දී තිබිනි.

### කොහු කර්මාන්ත අංශය

කොහු කර්මාන්තයේ කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ අරමුණින් අපනයන වෙළෙඳපොලට භූ කලාල නිෂ්පාදනය සඳහා අඩු පිරිවැයකින් හා වැඩි කාර්යක්ෂමතාවයකින් යුතු යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු අංශයට අමාත්‍යාංශය දායකත්වය සපයන ලදී.

### ඇසුරුම් කර්මාන්ත අංශය

ඇසුරුම් කර්මාන්තයේ තාක්‍ෂණ ක්‍රමවේදයන් වර්ධනය කිරීම හා නව තාක්‍ෂණය හඳුන්වාදීම සඳහා එම ක්ෂේත්‍රයේ කර්මාන්තයන් හි තාක්‍ෂණ ශිල්පීන් සඳහා පුහුණු පාඨමාලාවන් හා සහතික පත්‍ර පාඨමාලාවන් පවත්වන ලදී. අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ප්‍රාදේශීය කර්මාන්ත වාණිජ මණ්ඩල මගින් ආහාර නිෂ්පාදකයින් සඳහා විවිධ පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබීය.

ඇසුරුම්කරණයේ නව තාක්‍ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දීමට හා සියලුම දේශීය කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ශක්තීන් හා ධාරිතාවයන් ප්‍රදර්ශනය කිරීම සඳහා "ලංකා පැක් 2012" ජාත්‍යන්තර ප්‍රදර්ශනය සංවිධානය කරන ලදී. මේ සඳහා දේශීය හා විදේශීය කර්මාන්තකරුවන් 150 දෙනෙකු සහභාගි වූ අතර මෙම ප්‍රදර්ශනය මගින් ඇසුරුම් කර්මාන්තයන් හි නියැලෙන්නන් සඳහා යන්ත්‍ර සූත්‍ර සැපයුම්කරුවන්, අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් සමග දේශීය හා විදේශීය

වෙළඳපොල පිළිබඳ තොරතුරු හුවමාරුව සඳහා අවස්ථාවක් උදා විය.

තාක්‍ෂණික පහසුකම් හා අනෙකුත් අවශ්‍ය තොරතුරු ලබාගැනීමට නොහැකි ප්‍රාදේශීය කර්මාන්ත සඳහා ඇසුරුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු එම ප්‍රදේශවල සංවිධානය කරන ලදී.

**තත්ත්ව සහතික ලබාදීම**

ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාදීමේ වැඩසටහන යටතේ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධ ISO 22000, HACCP, GMP සහ SLS යන ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාදීම සඳහා කර්මාන්ත 20 ක් යොමුකරන ලදී.


**ආහාර සුරක්ෂිතතාව**

ආහාර සුරක්ෂිතතාව පිළිබඳ සහතික ලබාදීමේ වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කිරීම සහ මෙම වැඩසටහන වෙනත් ක්ෂේත්‍ර සඳහා, නිදසුන් ලෙස ඇසුරුම් කර්මාන්තය, ආහාර ගබඩාකරණ හා ප්‍රවාහන ආයතන, ආහාර ආශ්‍රිත වෙනත් කර්මාන්ත සඳහා හඳුන්වා දීමට කටයුතු සංවිධානය කරන ලදී.

**ප්‍රති අපනයන දිරිගැන්වීම**

ප්‍රති අපනයන දිරිගැන්වීම සඳහා තීරු බදු සහන ලබාදීමේ වැඩසටහන (TIEP) යටතේ කර්මාන්තකරුවන් 506 ක් සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත.

**කර්මාන්ත අංශවල අපනයන ප්‍රගතිය**




*මූලාශ්‍රය: සංවර්ධන අංශ 1*

# සංවර්ධන අංශ - 2

## හැඳින්වීම

පවත්නා කර්මාන්ත ශක්තිමත් කිරීම හා නව කර්මාන්ත බිහිකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත් ඒ මඟින් තත්ත්වයෙන් ඉහල හා ගුණත්වයෙන් යුක්ත වූ භාණ්ඩ නිපදවා ජාත්‍යන්තරය ජය ගැනීමට හැකි ශක්තීන් උදාකරලීමත් මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

මේ යටතේ පවතින කර්මාන්ත අංශ වනුයේ, අච්චු හා තෙරපුම් අච්චු කර්මාන්ත, රබර් ආශ්‍රිත කර්මාන්ත, යන්ත්‍රෝපකරණ හා මූලික ලෝහ කර්මාන්ත, බෝට්ටු හා උපාංග නිෂ්පාදන කර්මාන්ත, වාහන නිෂ්පාදන හා ප්‍රවාහන උපකරණ නිෂ්පාදන කර්මාන්ත, දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත, ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත, රසායනික ද්‍රව්‍යය ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත සහ දෘෂ්ටි හා ඡායාරූප නිෂ්පාදන කර්මාන්ත යනාදියයි.

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### අච්චු හා තෙරපුම් අච්චු නිෂ්පාදන

අච්චු හා තෙරපුම් අච්චු නිෂ්පාදනය සඳහා වූ පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයේ දෙවන අදියරෙහි කටයුතු අවසන් විය. මේ සඳහා අමාත්‍යාංශය රු.මි. 85 ක් වියදම් කර ඇති අතර මොරටුව විශ්ව විද්‍යාලය සහ පෞද්ගලික අංශය එක්ව රු.මි. 30 ක් පමණ වැය කර ඇත. විශ්ව විද්‍යාල සිසුන් මෙන්ම බාහිර සිසුන් සඳහා ද ප්‍රායෝගික පුහුණුව ලබා දීම, කර්මාන්තකරුවන් සඳහා සේවා සැපයීම ආදී කටයුතු සාර්ථකව මේ වන විට පවත්වාගෙන යනු ලබයි. සේවා අවශ්‍යතා 140 ක් සපුරා ඇති අතර 90 දෙනෙකු සඳහා පුහුණුව ලබා දී ඇත.

### රබර් නිෂ්පාදන

ශ්‍රී ලංකාවේ අපනයන භෝග අතරින් රබර් අපනයනයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. නිෂ්පාදන කර්මාන්ත අංශ අතරින් එකතු කල අගය ඉහලම නිෂ්පාදන කර්මාන්ත අංශය වන්නේ ද රබර් ආශ්‍රිත නිෂ්පාදන අංශයයි. ඒ අනුව රබර් ආශ්‍රිත නිෂ්පාදන අංශයන් හි එකතු කල අගය වැඩි කිරීම සඳහා අවශ්‍ය දත්ත ගබඩාවක් පිහිටුවීමට අමාත්‍යාංශය කටයුතු කර ඇත. රබර් නිෂ්පාදන අංශය සඳහා දත්ත බැංකුව ස්ථාපිත කිරීම සඳහා EML Consultants ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

### බෝට්ටු නිෂ්පාදන

බෝට්ටු නිෂ්පාදන හා අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය දිවයින තුල ප්‍රචලිත කිරීම අරමුණු කොටගෙන බෝට්ටු නිෂ්පාදකයින්ගේ සංගමය සමඟ එක්ව වසර දෙකකට වරක් පවත්වන බෝට්ටු ප්‍රදර්ශනය (Boat Show) මෙවරත් මැයි මස 18 - 20 යන තෙදින තුල ඉතා සාර්ථකව සිරිමාවෝ බණ්ඩාරනායක ප්‍රදර්ශන ශාලාවේදී පැවැත් වූ අතර එයට 120 කට අධික දෙස් විදෙස් ප්‍රදර්ශකයන් සහභාගි විය. මෙය අදාල ක්ෂේත්‍රයේ සුළු හා මධ්‍ය පරිමාණ බෝට්ටු නිෂ්පාදන කර්මාන්තය දිරිමත් කිරීමටත් රට තුල සංචාරක ව්‍යාපාරයේ දියුණුව සඳහා බෙහෙවින් බලපෑමක් කිරීමටත් හේතු වූ ව්‍යාපෘතියකි.

### උණබට ආශ්‍රිත නිෂ්පාදන

ලංකාවේ දේශගුණයට හිතකර වගාවක් වන උණ වගාව ජනතාව අතර ප්‍රචලිත කිරීමට අවශ්‍ය කටයුතු එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය (UNIDO) එක්ව සිදු කරමින් පවතී. මේ වන විට උණ වගාව ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය ඉඩම් වැවිලි කර්මාන්ත අංශයේ මැදිහත් වීම මත හඳුනාගෙන ඇති අතර උණ බම්බු ආශ්‍රිත නිෂ්පාදනයන් කෙරෙහි ආයෝජකයන් පෙළඹවීමේ කාර්යය අමාත්‍යාංශයේ මැදිහත් වීම යටතේ සිදු කරනු ලබයි. දැනටමත් පෞද්ගලික කර්මාන්ත ආයතනයක් උණ බම්බු ආශ්‍රිත නිෂ්පාදන කටයුතු ආරම්භ කර ඇත.

### යන්ත්‍රෝපකරණ නිෂ්පාදන අංශය

දේශීය කර්මාන්තකරුවන් දිරි ගැන්වීම හා ග්‍රාමීය අංශයට නවීන තාක්ෂණය හඳුන්වා දීම තුලින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තය නගා සිටුවීම අරමුණු කරගත් යන්ත්‍රෝපකරණ වෙළඳ ප්‍රදර්ශනය හත්වන වරටත් 2012 අගෝස්තු මාසයේ දී පවත්වන ලදී.

### ලුහු කර්මාන්ත අංශයේ සමීක්ෂණය

සාම්ප්‍රදායික ලුහු ඉංජිනේරු කර්මාන්තය නංවාලීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වැබඩ ග්‍රාමය කේන්ද්‍ර කරගනිමින් සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම හා සමීක්ෂණ වාර්තාවක් පිළියෙල කරන ලදී.

# සංවර්ධන අංශ - 3

## හැඳින්වීම

ජාත්‍යන්තර වෙළෙඳපල තරඟකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක තත්ත්වයෙන් උසස් භාණ්ඩ නිෂ්පාදනය සඳහා පාවහන්, සම් භාණ්ඩ, පිඟන් භාණ්ඩ, විද්‍යුත් හා විදුලි උපකරණ, ඖෂධ හා සුවඳ විලවුන් සහ තීන්ත හා මුද්‍රණ කටයුතු යන කර්මාන්ත උප අංශ ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම මෙම අංශයෙන් සිදුකෙරේ.


## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### සම් භාණ්ඩ නිෂ්පාදන අංශය

සම්භාණ්ඩ කර්මාන්තය සඳහා අවශ්‍ය නිම කල සම් සඳහා අනාගතයේ දී අයකරන බදු ඉවත් කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම පර්යේෂණ සඳහා අවශ්‍ය විද්‍යාගාර උපකරණ ද මිලදීගෙන ඇත.

අමාත්‍යාංශය අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව 2007 වර්ෂයේ අන්තර්ජාතික මට්ටමේ සම්භාණ්ඩ හා පාවහන් ප්‍රදර්ශනයක් පවත්වනු ලැබූ අතර එම ප්‍රදර්ශනය සිව්වන වරටත් 2012 වසරේ පෙබරවාරි මස පවත්වනු ලැබීය. මෙමඟින් කර්මාන්තකරුවන්ට විදේශීය වෙළෙඳපල අවස්ථා උදාකර ගැනීමට හා ඔවුන්ගේ කර්මාන්තයට නවතම විලාසිතාවන් පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අවස්ථාව සැලසිනි. මේ සඳහා ප්‍රදර්ශකයන් 200 කට අධික සංඛ්‍යාවක් සහභාගි විය.

පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන පුහුණු පාසලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු නිමකොට ඇති අතර කෙටි කාලීන පුහුණු පාඨමාලාවන් ආරම්භ කර ඇත.




මූලාශ්‍රය: සංවර්ධන අංශ 3

### පිඟන් භාණ්ඩ අංශය


මැටි/බෝල මැටි සහ ඛනිජ නිධි හඳුනාගැනීමේ සමීක්ෂණයක් සිදු කර ස්ථාන 197ක් පරීක්ෂණය කරන ලද අතර, ස්ථාන 27 ක් හඳුනාගෙන ඇත. අමාත්‍යාංශයේ සහභාගීත්වය ඇතිව භූ විද්‍යා පතල් හා කැණීම් කාර්යාංශයත් සමඟ සමීක්ෂණ කටයුතු නිම කරන ලදී.

### විදුලි හා විද්‍යුත් කර්මාන්ත අංශය

විදුලි හා විද්‍යුත් කර්මාන්තකරුවන් සඳහා පෙර වැඩුම් මධ්‍යස්ථානයක් මොරටුව විශ්ව විද්‍යාලය තුළ ස්ථාපිත කර ඇත.

නව නිපයුම් ඉදිරිපත් කළ ශිෂ්‍යයින් 10 ක් සඳහා තාක්ෂණික උපකරණ ලබාදීමට කටයුතු කර ඇත.

විදුලි හා විද්‍යුත් භාණ්ඩ කර්මාන්ත අංශයේ නියුක්ත සුළු පරිමාණ නැගී එන කර්මාන්තකරුවන් හා නව නිපැයුම්කරුවන් සඳහා තාක්ෂණික වශයෙන් පහසුකම් සපයන මධ්‍යස්ථානයක් මොරටුව විශ්ව විද්‍යාලය හා එක්ව එම විශ්ව විද්‍යාලය තුළ පිහිටුවා ඇත.




මූලාශ්‍රය: සංවර්ධන අංශ 3


**ඖෂධ නිෂ්පාදන අංශය**

ඉහත වෙළඳපල අවශ්‍යතාවයෙන් සුළු ප්‍රමාණයක් මහා පරිමාණ නිෂ්පාදකයින් 10 ක් දේශීය වශයෙන් නිපදවයි.

ඖෂධ කර්මාන්තයේ නියැලී සිටින දේශීය හා විදේශීය ඖෂධ නිෂ්පාදන සමාගම් 200 ක් පමණ ඇති අතර, මහා පරිමාණ නිෂ්පාදන සමාගම් 10 ක් පමණ එයට දායකත්වය සපයයි.

ඖෂධ පර්යේෂණාගාරයක් කොළඹ විශ්ව විද්‍යාලය තුල පිහටුවා ඇති අතර එහි දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපකරණ මිලදීගෙන ඇත.

ඖෂධ නිෂ්පාදන අංශයේ හැකියා වර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.




මූලාශ්‍රය: සංවර්ධන අංශ 3

# කර්මාන්ත ලියාපදිංචි කිරීමේ හා කළමනාකරණ තොරතුරු අංශය

### හැඳින්වීම

මෙම අංශය වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යයක් වන්නේ 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනතට අනුකූලව නිෂ්පාදන කර්මාන්ත මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීමය. මෙම ලියාපදිංචි කර්මාන්තවලට අදාල දත්ත පාදක කොට ගෙන මෙම අංශය මගින් දත්ත සමුදායක් පවත්වාගෙන යනු ලැබේ.

මෙයට අමතරව විශේෂයෙන් බාහිර පරිශීලකයන්ගේ පහසුව උදෙසා ලියාපදිංචි කර්මාන්තවල මූලික දත්ත අප වෙබ් අඩවිය වන www.industry.gov.lk තුලින් ලබාගත හැකිවන පරිදි වෙබ් ආශ්‍රිත දත්ත සමුදායක් ද පවත්වාගෙන යනු ලබයි.

තවද මෙම රැස්කරනු ලබන දත්ත සකස් කොට විශ්ලේෂණය කිරීමෙන් පසු බාහිර වශයෙන් දත්ත පරිශීලනය කරනු ලබන උපදේශකවරුන්, පර්යේෂකයින්, සහ සිසුන් වැනි කාණ්ඩ වෙත ඔවුන්ගේ අවශ්‍යතා මත බෙදා හරිනු ලබන අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර පරිශීලන කටයුතු සඳහාද යොදාගනු ලැබේ. තවද සාර්ව මට්ටමේ දත්ත අඩංගු දත්ත සමුදායකයක් ද පවත්වාගෙන යනු ලබන අතර එමගින් කර්මාන්ත අංශයේ ක්‍රියාකාරීත්වය අනෙකුත් අංශ හා ජාතික මට්ටමෙන් ඇගයීමකට ලක්කරනු ඇත.

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### කර්මාන්ත තොරතුරු ආශ්‍රිත දත්ත සමුදායයන් පවත්වාගෙන යාම

#### කර්මාන්ත ලියාපදිංචිය ආශ්‍රිත දත්ත සමුදාය

කර්මාන්ත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පතෙහි අඩංගු දත්ත පාදක කොටගෙන මෙම දත්ත සමුදාය ගොඩනගා ඇති අතර එය නිරතුරුව යාවත්කාලීන කරනු ලබයි. එහි කර්මාන්තශාලාවේ පිහිටීම, අයිතිය, නිෂ්පාදන භාණ්ඩ, ඒවායේ නිෂ්පාදන ප්‍රමාණය හා වටිනාකම, ස්ථාවර වත්කම්වල වටිනාකම හා සේවක සංඛ්‍යාව යනාදී තොරතුරු අඩංගුව ඇත. මුළු ලියාපදිංචි කර්මාන්ත සංඛ්‍යාව හා සැසඳීමේ දී වැඩිම දායකත්වයක් පෙන්නුම් කරනුයේ සැකසූ ලෝහ නිෂ්පාදන, යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහන උපකරණ අංශය මගිනි.

#### ජාලකරණ පහසුකම්

අමාත්‍යාංශය තුල සංග්‍රහක පරිගණක පනහකින් පමණ යුක්ත තත් ප්‍රදේශ ජාලයක් පවත්වාගෙන යනු ලබන අතර එමගින් ප්‍රධාන වශයෙන් දත්ත හුවමාරුව, සම්පත් පරිහරණය සහ අන්තර්ජාල පහසුකම් සපයනු ලබයි. අන්තර්ජාල පහසුකම් ප්‍රධාන වශයෙන් ADSL සම්බන්ධතා දෙකක් මගින් සපයනු ලබන අතර Wi-Fi පහසුකම තුලින් ද දිනපතා රාජකාරී කටයුතු වඩාත් පහසුවෙන් ඉටුකිරීමට අවස්ථාව ද උදාකර ඇත. තවද ස්ථාපිත නව සේවාදායක පරිගණකයෙහි විවෘත මෘදුකාංග ස්ථාපිත කොට වඩාත් කාර්යක්ෂම ලෙස පරිගණක ජාලය ක්‍රියා කිරීමට කටයුතු සලසන ලදී. අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් විමසනු ලදුව එම අවශ්‍යතා මත විවිධ පොත්පත්, සඟරා, කාලීන ප්‍රකාශන හා වාර්තා යනාදීය පුස්තකාලය සඳහා මිලදී ගැනීමට පසුගිය කාලය තුල කටයුතු සලසන ලදී. පුස්තකාලය භාවිතා කරන අයගේ පහසුව සඳහා එහි අභ්‍යන්තර පිහිටීම ද ක්‍රමවත්ව සකසන ලදී.

#### කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි ක්‍රියාකාරී කර්මාන්ත ආයතන -2012

| | අංශය | ආයතන සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ආහාර පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන | 07 |
| 2 | රෙදිපිළි ඇඟළුම් සහ සම් නිෂ්පාදන | 07 |
| 3 | දැව සහ දැව නිෂ්පාදන | 00 |
| 4 | කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන | 06 |
| 5 | රසායනික, ඛණිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 07 |
| 6 | ලෝහ නොවන ඛණිජ නිෂ්පාදන | 04 |
| 7 | මූලික ලෝහ නිෂ්පාදන | 01 |
| 8 | සැකසූ ලෝහ නිෂ්පාදන, යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහන උපකරණ | 08 |
| 9 | අනෙකුත් | 02 |
| | **එකතුව** | **42** |

මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි කිරීමේ හා කළමනාකරණ තොරතුරු අංශය

#### වෙබ් අඩවිය ආශ්‍රිත කටයුතු

වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම යටතේ අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වැඩිදියුණු කළ අතර මාර්ගගත ක්‍රම මගින් කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත ඉදිරිපත් කිරීමේ පහසුකම, දැනට අඩංගු

විමසුම් තොරතුරුවල වෙනසක් ඇත්නම් එය මාර්ගගතව දැනුම් දීමේ පහසුකම හා වෙබ් ආශ්‍රිත දත්ත සමුදාය මගින් විවිධ දත්ත ක්ෂෙත්‍ර පාදකකොට ගනිමින් සංඛ්‍යා ලේඛණ වාර්තා මාර්ගගතව සැකසීම වැනි පහසුකම් ඇතිකර ඇත.

### 2012.12.31 දිනට ලියාපදිංචි කර්මාන්ත වල ප්‍රාදේශීය ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | කර්මාන්ත සංඛාව |
|---|---|
| කොළඹ | 1272 |
| ගම්පහ | 349 |
| කළුතර | 107 |
| ගාල්ල | 37 |
| පුත්තලම | 38 |
| නුවර | 78 |
| කුරුණෑගල | 35 |
| මාතර | 39 |
| හම්බන්තොට | 15 |
| නුවරඑළිය | 6 |
| රත්නපුර | 12 |
| අනුරාධපුර | 9 |
| බදුල්ල | 7 |
| කෑගල්ල | 15 |
| මාතලේ | 14 |
| මොණරාගල | 2 |
| පොලොන්නරුව | 3 |
| අම්පාර | 4 |
| ත්‍රිකුණාමලය | 3 |
| මඩකළපුව | - |
| වව්නියා | - |
| යාපනය | 2 |
| මන්නාරම | 1 |
| එකතුව | **2048** |

මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචි කිරීමේ හා කළමනාකරණ තොරතුරු අංශය

# ඵලදායිතා සංවර්ධන අංශය

### හැඳින්වීම

ගෝලීය තරගකාරිත්වයට මුහුණ දිය හැකි අයුරින් ශ්‍රී ලාංකික කාර්මික නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා ප්‍රමිතීන් ශක්තිමත් කර, කාර්මික නිෂ්පාදන අංශයේ ඵලදායිතාව ඉහල නැංවීමට අවශ්‍ය පරිසරය සකස් කිරීමට උවමනා පහසුකම් සැලසීම, ඵලදායිතා සංවර්ධන අංශයේ මූලික අභිප්‍රාය වේ.

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### කාර්මික අංශයේ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහල නැංවීමේ වැඩසටහන

- මෙහෙයුම් කමිටුව ස්ථාපිත කර ඇත.
- කර්මාන්ත ආයතන 27 ක, මූලික බලශක්ති පරිභෝජන දත්ත හා තොරතුරු රැස්කර විශ්ලේෂණය කර ඇත.
- තෝරාගත් කර්මාන්ත ආයතන 15 ක කළමනාකරුවන් 30 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.
- මෙම අමාත්‍යාංශයේ බලශක්ති සංවර්ධන වැඩසටහන සඳහා සහභාගිවන ආයතන 14 ක් සමඟ අවබෝධතා ගිවිසුම් සකස් කිරීම හා අත්සන් කර ඇත.
- බලශක්ති උපදේශකයන් තෝරාගත් කර්මාන්ත ආයතන 15 ක මූලික බලශක්ති විගණන නිරීක්ෂණය කරන ලදී.
- උපදේශකයන් තෝරා ගත් කර්මාන්ත 07 ක් සඳහා මූලික බලශක්ති විගණන වාර්තා හා යෝජනා සකස් කර දී ඇත.

### ශ්‍රී ලංකාවේ කාර්මික අපද්‍රව්‍යය කළමනාකරණය විධිමත් කිරීම හා කාර්මික අපද්‍රව්‍යය හුවමාරුව තුළින් අතුරු නිෂ්පාදන වැඩි දියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය බස්නාහිර, වයඹ, දකුණු හා මධ්‍යම පළාත්වල ක්‍රියාත්මක වූ අතර එමඟින් නිම කර ඇති කාර්යයන් ‍:

- පළාත් පාලන ආයතන, මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා, වාණිජ මණ්ඩල හා නිෂ්පාදකයින්ගේ සංවිධාන අතර සම්බන්ධතා ගොඩනගා ඇත.
- කාර්මික නිෂ්පාදන ආයතන සම්බන්ධීකරණය කිරීම තුලින් දත්ත හා තොරතුරු ජාලයක් ගොඩ නගා ඇත.
- මධ්‍යම පරිසර අධිකාරිය, ජාතික සුපිරිසිදු නිෂ්පාදන මධ්‍යස්ථානය, කාර්මික තාක්ෂණ ආයතනය, කාර්මික සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වන හා පරිසර විද්‍යා අංශය, කොළඹ මහ නගර සභාව සහ කර්මාන්ත හා වාණිජ මණ්ඩලය සමඟ එක්ව
    - මෙහෙයුම් කමිටුවක් / උපදේශක සභාවක් ස්ථාපනය කිරීම
    - කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.
    - අදාළ ක්‍රියාකාරි වැඩසටහන් සකස් කරන ලදී.

### කොන්ක්‍රීට් හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීමේ වැඩසටහන

මෙම ව්‍යාපෘතිය බස්නාහිර, වයඹ, දකුණු හා මධ්‍යම පළාත්වල ක්‍රියාත්මක වූ අතර එමඟින් නිම කර ඇති කාර්යයන් ‍:

- කොන්ක්‍රීට් හා සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනයන් හි නියුතු නිෂ්පාදකයන් 40 දෙනෙකුගෙන් පමණ මූලික දත්ත හා තොරතුරු රැස් කර ඇත.
- කොන්ක්‍රීට් හා සිමෙන්ති නිපැයුම් කර්මාන්ත අංශය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සකස් කර ඇති ප්‍රමිතින් හඳුනා ගැනීමක් කර ඇත.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සහ ඉදිකිරීම් පුහුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ආයතනය වැනි ආයතන සම්බන්ධීකරණය කිරීමෙන් කොන්ක්‍රීට් සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන අංශය වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් සකස්කර ඇත. (ජාතික ඉංජිනේරු පර්යේෂණ ආයතනය දැනට දළ වැඩ සටහනක් සකස් කර ඇත.)

# රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

### හැඳින්වීම

රසායනික අවි සම්මුතිය යනු රසායනික අවි වැඩි දියුණු කිරීම, නිෂ්පාදනය කිරීම, හුවමාරු කිරීම, ගබඩා කිරීම, භාවිතය හා ඒවා විනාශ කිරීම පිළිබඳ වූ ජාත්‍යන්තර ගිවිසුමකි. 1993 දී ඇතිකර ගන්නා ලද මෙකී සම්මුතිය මගින් සමූහ ඝාතක අවි කාණ්ඩයේ වූ රසායනික අවි සියල්ලම සම්පූර්ණයෙන් තහනම් කිරීම සිදුකරයි. තවද එය නිසි ලෙස ක්‍රියාත්මක වේදැයි තහවුරුකර ගැනීම උදෙසා යාන්ත්‍රණයක් සහිතවීම හේතුකොට ගෙන මෙම සම්මුතිය අනෙක් සම්මුතීන්ගෙන් වෙනස් වේ.

රසායනික අවි සම්මුතිය 1994 අගෝස්තු මස 19 වෙනි දින සිට ශ්‍රී ලංකාව තුල වලංගු කරන ලද අතර අංක 58/2007 රසායනික අවි සම්මුති පනත 2008 අගෝස්තු 15 දින සිට කර්මාන්ත සංවර්ධන අමාත්‍යවරයා විසින් බලාත්මක කරන ලදී.

රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය යනු සම්මුතියට අදාල ජාතික ක්‍රියාත්මක කිරීමේ කාර්යයභාරය සපුරාලීම උදෙසාත් නෙදර්ලන්තයේ පිහිටුවා ඇති රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය හා අනෙකුත් සාමාජික රාජ්‍යයන් සමග සාධනීය සම්බන්ධතාවයක් පවත්වා ගැනීම උදෙසාත් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත සංවිධානයකි.

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### කර්මාන්ත සඳහා බලපත්‍ර නිකුත් කිරීම

රසායනික ද්‍රව්‍ය ආනයනකරුවන් / අපනයනකරුවන් අටදෙනෙකු ජාතික අධිකාරිය යටතේ අලුතින් ලියාපදිංචි වී ඇති අතර කර්මාන්ත අටක් තම ලියාපදිංචිය අලුත්කරවාගෙන ඇත. ශ්‍රී ලංකාව තුල ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය ආනයනකරුවන් තිස් දෙනෙක් සඳහා රසායනික ද්‍රව්‍යය ආනයනය කිරීමට බලපත්‍ර ජාතික අධිකාරිය විසින් නිකුත් කෙරේ. කර්මාන්ත මඟින් සිදුකරන ඉල්ලීමක් මත රසායනික අවි සම්මුති පනතට අනුකූලව ආනයනකරුවන් සඳහා බලපත්‍ර නිකුත් කෙරේ.

### ජාතික ආරක්ෂක වැඩපිළිවෙල

රසායනික ද්‍රව්‍යය නිසා සිදුවන හදිසි අනතුරක දී හෝ රසායනික අවි ප්‍රහාරයක දී හෝ විෂ රසායනික ද්‍රව්‍යය / කාන්දුවීමක දී ක්‍රියාත්මක වීම සඳහා ප්‍රථම ක්‍රියාකාරින්ගේ පුහුණු වැඩමුළුවක් ජාතික ආරක්ෂක වැඩපිළිවෙල වැඩිදියුණු කිරීම සඳහා පවත්වන ලදී. ශ්‍රී ලංකා හමුදාවේ, පොලිසියේ ගිනි නිවන සේවා දෙපාර්තමේන්තුවේ තෝරාගන්නා ලද පිරිස් සහ වෛද්‍ය වෘත්තිකයන් මේ වැඩසටහන යටතේ පුහුණුවන ලදී. ප්‍රථම ක්‍රියාකාරින් සඳහා වූ අවසාන පුහුණු වැඩසටහන 2012 අප්‍රේල් මස 2-6 දක්වා වැල්ලවත්තේ ගිනි නිවීමේ හා ගලවාගැනීමේ මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

ජාතික අධිකාරිය විසින් රසායනික ද්‍රව්‍යය හේතු කොටගෙන සිදුවන හදිසි අනතුරු කළමනාකරණය කිරීම පිළිබඳ වෛද්‍ය විශේෂඥයන් සඳහා පුහුණු වැඩසටහනක්

ජාතික රෝහලේ දී පවත්වන ලදී. මේ අවස්ථාව සඳහා විවිධ රෝහල්වලින් වෛද්‍යවරු 32ක් සහභාගි වුණි.

රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය හා සර්බියාව, පින්ලන්තය හා දකුණු කොරියානු රාජ්‍යයන් සමඟ එක්ව සංවිධානය කරන ලද රසායනික ද්‍රව්‍යය නිසා සිදුවන හදිසි අවස්ථාවක දී ආරක්ෂාවීම හා සහාය වීම සඳහා වන ජාත්‍යන්තර පුහුණු අවස්ථාවන් ප්‍රථම ක්‍රියාකාරි කණ්ඩායමේ සිටින ශ්‍රී ලංකා යුද හමුදාවේ නිලධාරින් දෙදෙනෙකු සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකු හට ලබා දෙන ලදී.

හදිසි අවස්ථාවන් කළමනාකරණ සැලැස්මක් සැකසීමේ මූලික පැහැදිලි කිරීමක් ද සහිතව රසායනික ද්‍රව්‍යය නිසා ඇතිවන හදිසි අවස්ථාවන් කළමනාකරණය කිරීම පිළිබඳ වැඩමුළුවක් 2012 මැයි 29 දින කළුතර කර්මාන්තපුරයේ කර්මාන්තකරුවන්හට පවත්වන ලදී. කර්මාන්ත සමීක්ෂණය 2012 ජුලි 24 වන දින ආරම්භ කරන ලද අතර කර්මාන්තපුරයෙහි කර්මාන්ත 23 ක් විමර්ශනය කරන ලදී.

### රසායනික ද්‍රව්‍යය නිසා ඇතිවන හදිසි අවස්ථාවන්වලට සහාය වීම

2012 මැයි 15 වන දින සිදූව රමාඩා හෝටලයේ සිදුවූ පොස්ජීන් වායු කාන්දුව නිසා ඇතිවූ අනතුර විමර්ශනයේදී එම ස්ථානයේ වායු නියැදි ලබාගැනීමට ජාතික අධිකාරිය සහාය විය. ශ්‍රී ලංකා පොලීසියේ ඉල්ලීම මත හෝටලයෙන් වායු නියැදි ලබාගැනීමට රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට තාක්ෂණික හා විශේෂඥ පහසුකම් ලබාදෙන ලදී.
2012 අප්‍රේල් 12 වන දින කළුතර කර්මාන්තපුරයේ පරන්තන් රසායනික කම්හලෙහි සිදුවූ ක්ලෝරීන් වායු කාන්දුව විමර්ශනයට තාක්ෂණික හා විශේෂඥ

දැනුම ජාතික අධිකාරිය විසින් ලබාදෙන ලදී. අවසන් විමර්ශන වාර්තාව, ආරක්ෂාව හා සුරක්ෂිත බව වැඩිදියුණු කිරීම සඳහා 2012 ජුනි 16 වන දින රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත ලබාදුනි.

**ආසියානු කලාපීය සාමාජික රාජ්‍යයන්ගේ ජාතික අධිකාරිවල දහවන කලාපීය සමුළුව**

ශ්‍රී ලංකා ජනරජයේ ආරාධනය මත ආසියානු කලාපීය සාමාජික රාජ්‍යයන්ගේ ජාතික අධිකාරිවල දහවන කලාපීය සමුළුව රසායනික අවි තහනම් කිරීමේ සංවිධානයේ මූලිකත්වයෙන් කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ 2012 ජුනි මස 26 සිට 28 දක්වා පවත්වන ලදී. ආසියා පැසිපික් කලාපයේ රටවල් 29 කින් නියෝජිතයන් 40 සහ රසායනික අවි තහනම් කිරීමේ

සංවිධානයේ නියෝජිතයින් 6 දෙනෙකු මෙම සමුළුව සඳහා සහභාගි විය.

රසායනික අවි තහනම් කිරීමේ සංවිධානයේ අධ්‍යක්‍ෂ ජනරාල් අතිගරු අහමට් උසුම්කු මහතා මෙම සමුළුව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයාගේ ආරාධනය පරිදි සහභාගි විය.

**උපද්‍රවකාරි රසායනික ද්‍රව්‍ය හැසිරවීම සහ ආරක්ෂාව පිළිබඳ පුහුණු පාඨමාලාවක්**

ජාතික අධිකාරිය විසින් සීමාසහිත නාවික හා ගුවන් සේවා තොරතුරු සහ පර්යේෂණ (පුද්ගලික) සමාගමේ සහාය ඇතිව වරාය අධිකාරියේ මහපොල ශ්‍රවණාගාරයේ උපද්‍රවකාරි රසායනික ද්‍රව්‍ය හැසිරවීම සහ ආරක්ෂාව පිළිබඳ පුහුණු පාඨමාලාවක් 2012 සැප්තැම්බර් මස 12 වන දින පැවැත්වීය.

රසායනික කර්මාන්ත අංශයේ තිරසාර කාර්මික සංවර්ධනයක් උදෙසා උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය හැසිරවීම, සෞඛ්‍ය, ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතභාවය පිළිබඳව මූලික දැනුම ලබාදීම සඳහා ජාතික අධිකාරිය, කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය සමග එක්ව සහතික පත්‍ර පාඨමාලාවක් 2012 සැප්තැම්බර් 26 වන දින පැවැත්වීය.

# සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය

## හැඳින්වීම

සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන සියලුම සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වඩාත් ශක්‍ය හා තිරසාර රාජ්‍ය ආයතන බවට පත් කිරීමට අවශ්‍ය සහය ලබා දේ. එකී අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම අංශය මඟින් මෙම රාජ්‍ය ආයතනයන් හී සියලුම වත්කම්වල ඵලදායීතාව වැඩිදියුණු කිරීමට ක්‍රියා මාර්ග ගැනීම තුලින් ආදායම් උපරිම කිරීම සහ උපාය මාර්ගික ව්‍යාපාර සැලසුම් හඳුන්වා දීම තුලින් ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමේ කටයුතු හඳුන්වා දීම ආරම්භ කර ඇත. ඊට අතිරේකව මෙම ව්‍යවස්ථාපිත ආයතනවල දෛනික ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම ද මෙම අංශය මඟින් සිදු කරයි.

මෙම අමාත්‍යාංශය යටතට ගැනෙන රාජ්‍ය ව්‍යාපාර ආයතන නම්,

- මාන්තායි ලුණු සමාගම
- කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය
- ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
- ලංකා ලේලන්ඩ් සමාගම
- ලංකා අශෝක් ලෙලන්ඩ් සමාගම
- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයන් හි නායකත්වය සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

## මාන්තායි ලුණු සමාගම

මාන්තායි ලුණු සමාගම පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් වන අතර, ලුණු නිෂ්පාදන හා අලෙවි කටයුතුවල නිරතව සිටී. ආයතනය විසින් වර්තමානයේ දී මන්නාරම හා යාපනය දිස්ත්‍රික්කවල පිළිවෙලින් පිහිටා ඇති මන්නාරම හා වෙම්මනි ලුණු ලේවායන්වල නිෂ්පාදන කටයුතු සිදුකරනු ලබයි. මෙම අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව මහා භාණ්ඩාගාරය ලබා දුන් රුපියල් මිලියන 25 ක් වැය කර මන්නාරම ලුණු ලේවායේ සංවර්ධන කටයුතු සිදු කර ඇත.

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය

ශ්‍රී ලංකාවේ විශාලතම මිනිරන් කැනීම් ආයතනය වන කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය පූර්ණ වශයෙන් රජය සතු සීමිත සමාගමකි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි ගැඹුරින් අඩි 2000 ක් පමණ වන කහටගහ මිනිරන් පතලෙහි කැණීම් කටයුතු සිදුකරනු ලබන මෙම ආයතනය මිනිරන් කැණීම් කටයුතු සඳහා හැකියාව හා ශක්තිය ඇති එකම රාජ්‍ය ආයතනය වේ. 2007 වර්ෂයේ දී කහටගහ ග්‍රැෆයිට් ආයතනය නැවත ආරම්භ කල දින සිට මේ දක්වා උපයා ඇති මුළු ආදායම රුපියල් මිලියන 452 කි.

## ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය

රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රයට වසර 24කට වැඩි කාලයක් සේවය සැපයු ඇඟළුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය සහ පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය ඒකාබද්ධ කර ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය, 2009 අංක 12 දරණ පනත යටතේ පිහිටුවනු ලැබු අතර, 2009 ජූනි මස 15 වන දින සිට එහි වැඩකටයුතු ආරම්භ කරන ලදී. මානව සම්පත්, අවශ්‍ය උපකරණ සහ ඉඩ පහසුකම් ලබා දීමෙන් කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබා දීම සහතික කිරීම පිණිස මෙම ආයතන දෙක ඒකාබද්ධ කරන ලදී. පේෂකර්මාන්ත හා ඇඟළුම් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා පුද්ගලයින් පුහුණු කිරීම ද. පර්යේෂණ සහ උපදේශන කාර්යයන් වැනි සේවාවන් ඉටු කිරීම ද මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණ වේ.

## ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය වැඩි දියුණු කරලීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ අති ප්‍රබල වැදගත්කම වටහාගෙන, 2006 අංක 17 දරණ පනත යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පිහිටුවා ඇති අතර, එමඟින් විශේෂයෙන්ම රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳ වැඩි අවධානයක් සහිතව ව්‍යවසාය සංවර්ධනයට පහසුකම් සැලසීම, උනන්දු කරලීම, ප්‍රවර්ධනය කිරීම හා අනුබල දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

## ලංකා ලේලන්ඩ් සමාගම

ලංකා ලේලන්ඩ් සමාගම 100% ක් පූර්ණ රජය සතු සමාගමක් වන අතර, 2008 වර්ෂයේ සිට මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ලංකා ලේලන්ඩ් සමාගම විසින් රජය සතු ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමේ කොටස් 42% කළමනාකරණය කිරීම හැර වෙනත් කිසිදු මෙහෙයුම් කටයුත්තක නිරතව නොසිටින බැවින් එකී ආයතනය ඈවර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය කර ඇත. ඒ

අනුව ලංකා ලේලන්ඩ් සමාගම ඇවර කිරීමේ කටයුතු සිදු කිරීමට මූලික කටයුතු සිදුකරන ලදී.

## සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයන්හි නායකත්වය සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල)

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයන් හි නායකත්වය සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (SMILE) III මඟින් ලබා දෙන ලද ණයවල, ආපසු අයකරන ලද ණය වාරික හා පොළිය මඟින් සකස් වූ, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයන් හි නායකත්වය සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල) ණය යෝජනා ක්‍රමය පහත සඳහන් අරමුණුවලින් යුතුව 2012 මැයි මස 01 වන දින සිට ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය විසින් මූලික පියවර ගෙන ඇත.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට මූල්‍යමය පහසුකම් සැපයීම හෝ ආර්ථිකමය හා මූල්‍යමය ස්ථාවරත්වයක් ගොඩ නගාගෙන ඇති ව්‍යාපෘති පුළුල් කිරීමට යොමු කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් හි කළමනාකාරීත්ව, ගිණුම්කරණ සහ තාක්ෂණික හැකියාවන් වැඩි දියුණු කිරීමට මූල්‍ය පහසුකම් සැපයීම.
- අතරමැදි මූල්‍ය ආයතනවල ආයතනික හැකියාවන් ශක්තිමත් කිරීම.

SMILE III (චක්‍රීය අරමුදල) මඟින් නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ ඒවායේ ඵලදායීතාවය වර්ධනය කිරීමට හෝ නිෂ්පාදනයන්ගේ තත්ත්වය වැඩිදියුණු කිරීමට හෝ නිෂ්පාදන මට්ටම වැඩි දියුණු කිරීමට අඩු පොළියට ණය ලබාදෙනු ලැබේ. එමෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් හි ධාරිතාවය සහ නිෂ්පාදන වැඩිදියුණු කිරීම මෙම ණය යෝජනා ක්‍රමය මඟින් ආවරණය කරනු ඇත.

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

### හැඳින්වීම

"කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්" ආයතනය මඟින් කළමනාකරණය කරනු ලබන කහටගහ මිනිරන් පතල් පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි දොඩන්ගස්ලන්ද මඩුරාගොඩ ගම්මානයෙහි ය. තවද එය, කොළඹ අගනුවර සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 90ක් පමණ දුරින් පිහිටා තිබේ. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන්නාවූ ද, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සම්පූර්ණයෙන්ම රජය සතු සීමිත වගකීම් සහිත ආයතනයක් වන එහි ප්‍රධාන කොටස් හිමිකරු වන්නේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා ය. මූලික ප්‍රතිපත්තිමය තීරණ ගැනීම රේඛීය අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයේ ආයතනික ප්‍රතිපත්ති මත විධායක සභාපතිවරයා ප්‍රධානකොට ගත් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සිදු කෙරේ.

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### නිෂ්පාදනය

2012 වර්ෂය තුළ මුළු මිනිරන් (කණින ලද මිනිරන්) නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 963.6 කි. 2007 වර්ෂයේ දී පතල් කටයුතු නැවත ආරම්භ කිරීමෙන් අනතුරුව මුළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 4,350කි. 2012 අප්‍රේල් සිට මාසයකට මෙට්‍රික් ටොන් 80 ක් වශයෙන් වූ නිෂ්පාදන ඉලක්කය සපුරා ගැණිනි. පසුගිය අවුරුදු 10 සමඟ සසඳා බැලීමේ දී, ඒක පුද්ගල මාසික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 0.138 සිට 1.466 දක්වා වැඩිවී තිබේ.

### ආදායම්

2000 වර්ෂයට පසු, ග්‍රැෆෙක්සෙල් ආයතනය සමඟ ගනුදෙනු කරමින්, වර්ෂ 2011 දී යුරෝපීය වෙළඳපොල වෙත ප්‍රවේශ වී ඇති අතර එක්සත් රාජධානියේ වෙළඳපොල වෙත ඉහල තත්ත්වයේ මිනිරන් අපනයනය කෙරිණි. ඒ අනුව, 2012 වර්ෂයේ කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය මෙට්‍රික් ටොන් 588.3 ක් අපනයනය කර තිබේ. පතල නැවත ආරම්භ කිරීමෙන් පසු, 2007 වර්ෂයේ සිට 2012 දක්වා මුළු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,272.4 කි. ඉහල තත්ත්වයේ මිනිරන් අලෙවිය හේතුකොට ගෙන, 2010/11 සහ 2011/12 කාල පරිච්ඡේදය තුල ආදායම වැඩිවිය.

2012 වසර තුල දී, මුළු ආදායම රුපියල් මිලියන 45කි. පතල් නැවත විවෘත කිරීමෙන් පසු, 2007 සිට 2012 දක්වා කාලය තුල කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය රුපියල් මිලියන 472.5 ක් උපයාගෙන තිබේ.

2012 වසර අවසානය වන විට, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය සතුව රුපියල් මිලියන 50 ක වටිනාකමකින් යුත් ස්ථාවර තැන්පතුවක් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් වලින් පවත්වාගෙන යනු ලැබේ. 2012 වසර අවසානය වනවිට, පවත්නා වත්මන් තොග ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,690.5 ක් වන අතර එහි ආසන්න වෙළඳපොල අගය රුපියල් මිලියන 358.6 කි.

### සංවර්ධන කටයුතු

2003 වර්ෂයේ සිට 2012 දක්වා කාලය තුල අඩි 565 සිට පියවරෙන් පියවර අඩි 2000 ක් දක්වා ගැඹුරකින් යුත් පතල පුනරුත්ථාපනය කරන ලදී.

වර්ෂ 2011/12 දී, 1845' සිට 1935' මට්ටම දක්වා පුනරුත්ථාපන කටයුතු නිමකොට තිබූ අතර මාසික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 80 සිට මෙට්‍රික් ටොන් 88 දක්වා වැඩි වී තිබේ.

දැනට සංවර්ධන වැඩ සටහන ඇතුළු 2000' මට්ටම දක්වා වූ පුනරුත්ථාපන වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ.
1845' සහ 2000' මට්ටම් අතර වූ, හදිසි අවස්ථාවක දී පිටවීමට තිබෙන ඉණිමං මාර්ගය සම්පූර්ණකොට පුනරුත්ථාපනය කරන ලදී.

ජම්බෝ බෑග් හඳුන්වාදීමෙන් සහ යාන්ත්‍රික පිරවුම් ඒකකයක් ස්ථාපිත කිරීමෙන්, ඇසුරුම් ක්‍රමය වැඩිදියුණු විය.

අත්හැර දමා තිබූ, මිනිරන් විවිධ ප්‍රමාණයට කුඩු කිරීමේ යන්ත්‍රය නැවත භාවිතයට ගන්නා ලදී,

කණිනු ලබන මිනිරන් පතල් ආවාටයේ මුදුනේ සිට පිරිසැකසුම් අංශය දක්වා ප්‍රවාහනය කිරීමේ පිරිවැය අවම කිරීම සඳහා පිරිසැකසුම් අංගණය සහ ගොඩනැගිල්ල නැවත පිළිවෙලකට සකස් කරන ලදී.

#### පර්යේෂණ හා සංවර්ධන කටයුතු

පර්යේෂණ හා සංවර්ධන (R&D) කටයුතු සඳහා භාවිතයට ගත හැකි තත්ත්වයට සකස් කිරීම දක්වා

තත්ත්ව පාලන රසායනාගාරය නවීකරණය කරන ලදී.

කොළඹ විශ්ව විද්‍යාලයේ, විද්‍යා සහ තාක්ෂණය පිළිබඳ පීඨයේ සහාය ඇතිව, කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය 2012 වර්ෂයේ දී ව්‍යාපෘතියක් ආරම්භකොට ඇති අතර එමඟින් මිනිරන් සන්නායකතා බුරුසු, මිනිරන් ගෑස්කට් ෂීට්, මිනිරන් ලිහිසි තෙල් සහ මිනිරන් ග්‍රීස් ආදී අයිතමයන් නිෂ්පාදනය කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත.

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය විසින්ම, කහටගහ මිනිරන් අමුද්‍රව්‍යය තත්ත්වාකාරයෙන්ම ප්‍රයෝජනයට ගනිමින් කෝව (crucibles) නිෂ්පාදනය කිරීමට උත්සුකවෙමින් සිටින අතර ඒ සඳහා අවශ්‍ය මූලික කටයුතු නිම කොට ඇත.

# මාන්තායි සෝල්ට් සමාගම

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදන කර්මාන්තය සම්බන්ධව ඉතා දීර්ඝ ඉතිහාසයක් සහිත මාන්තායි සෝල්ට් සමාගම සාමාන්‍ය ලුණු, අයඩින් ලුණු, අඹරන ලද ලුණු සහ කර්මාන්ත සඳහා ලුණු යන විවිධ වර්ගවල ලුණු නිෂ්පාදනය කරනු ලැබේ.

1938 වසරේ ආරම්භ කරන ලද ලුණු නිෂ්පාදන දෙපාර්තමේන්තුව 2001 වසරේ සිට මාන්තායි සෝල්ට් සමාගම නමින් ක්‍රියාත්මක වේ.

### මන්නාරම ලේවාය

2010 වසර වන විට මන්නාරම ලේවායේ නිෂ්පාදන ධාරිතාව නැංවීමේ අරමුණෙන් අක්කර 240 ක් වූ ලේවායේ වපසරියෙන් අක්කර 110 දක්වා නිෂ්පාදන බිම් ප්‍රමාණය සංවර්ධනය කර ඇත. 2011 වසරේ අක්කර 53 ක නිෂ්පාදන බිම් වශයෙන් සංවර්ධනය කර ඇත. ඒ අනුව දැනට අක්කර 163 ක බිම් ප්‍රමාණයක ලුණු නිෂ්පාදන කටයුතු සිදුවේ. වාර්ෂික ලුණු නිෂ්පාදනය දළ වශයෙන් මෙට්‍රික් ටොන් 4000 කි. සංවර්ධන කටයුතුවලට පෙර ලංකාවේ මුළු ලුණු නිෂ්පාදනයෙන් 2.6% ක් වූ මන්නාරම ලේවායේ නිෂ්පාදනය 2012 වසරේ දී 5% දක්වා වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

අක්කර 53 ක ඉදිරි සංවර්ධන කටයුතුවලින් 98% ක ප්‍රතිශතයක් නිමවී ඇත. සංවර්ධන කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමත මිලියන 25 ක මුදලෙන් මිලියන 24.95 ක් සංවර්ධන කටයුතු සඳහා වැයකර සංවර්ධන අදියර නිම කෙරිණි. 2012 වසර තුල දී පහත සඳහන් කාර්යන් නිම කොට ඇත.

- අක්කර 53ක බිම් ප්‍රමාණය සංවර්ධනය හා ලුණු නිෂ්පාදන වපසරිය ඉහල නැංවීම.
- ලුණු ස්ඵටිකකරණ ගැඹුරු තටාක 4 ක් ඉදිකිරීම.
- ගැඹුරු තටාක අවට බොරළු ඇතිරීම.
- ට්‍රැක්ටරයක් හා ට්‍රේලරයක් මිලට ගැනීම.
- ලේවාය සඳහා ඉහල ධාරිතාවයෙන් යුත් ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරීම.
- අයඩින් ලුණු නිෂ්පාදන යන්ත්‍රාගාර ගොඩනැගිල්ල අසල මෙට්‍රික් ටොන් 40 ක ධාරිතාවයෙන් යුත් විද්‍යුත් පාලම් තරාදිය සවි කිරීම.
- කලපුවලින් කරදිය ලබා ගැනීම සඳහා දිය යට සවිකරණ පොම්ප 02 ක් මිලට ගැනීම.

# ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

### හැඳින්වීම

ශ්‍රී ලංකාව තුල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා දිරි දෙමින් ඒවා ප්‍රවර්ධනය කරමින් හා පහසුකම් සපයමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වර්ධනය, ප්‍රසාරණය හා සංවර්ධනය තහවුරු කිරීම ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ කාර්යභාරයයි.

### 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

#### ජාතික ව්‍යාපාර සංසදය

ජාතික වශයෙන් හඳුනාගත් ව්‍යාපාරික ගැටළු හා පහළ මට්ටමේ නොවිසඳුණු ගැටළු ජාතික ව්‍යාපාර සංසදයේ දී සාකච්ඡා කරනු ලැබේ. වසර අවසන් වන විට රැස්වීම් එකොළහක් (11) පවත්වා ඇත.

#### දිස්ත්‍රික් ව්‍යාපාර සංසද

ව්‍යාපාරිකයන් සඳහා ව්‍යවසාය සංවර්ධන සේවාවන් ලබාදීම පිණිස දිස්ත්‍රික් ව්‍යාපාර සංසද ස්ථාපිත කර ඇත.

2012 වසරේ කිලිනොච්චිය, රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්කයන් හි නව දිස්ත්‍රික් ව්‍යාපාරික සංසද පිහිටුවිය. මීට අමතරව බදුල්ල, මාතලේ, මහනුවර, අනුරාධපුරය, මන්නාරම හා මඩකලපුව දිස්ත්‍රික්කයන් හි දිස්ත්‍රික් ව්‍යාපාරික රැස්වීම් පැවැත්විනි.

#### කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ගේ මාර්ගෝපදේශ ග්‍රන්ථය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් 2009 වසරේ දී කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ගේ මාර්ගෝපදේශ ග්‍රන්ථය හඳුන්වා දුන් අතර, 2012 වසරේ දී එය ත්‍රෛභාෂාවෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

2012 වසරේ ජාතික මට්ටමින් මාර්ගෝපදේශ ග්‍රන්ථය එළිදැක්වීමේ වැඩසටහන් කොළඹ දී, මාතලේ, අනුරාධපුර, රත්නපුර, බදුල්ල හා මඩකලපුව දිස්ත්‍රික්කවල ප්‍රාදේශීයව ද දියත් කරන ලදී.

#### ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරි වෙබ් අඩවියේ ධාරිතාව ඉහල නැංවීම හා තොරතුරුවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා පියවර ගන්නා ලදී.

#### "ගමට ඔබින ව්‍යාපාර" වැටසටහන

මෙම වැඩ සටහන යටතේ ප්‍රතිලාභීන් 130 ක් සඳහා ව්‍යවසාය සංවර්ධන පුහුණුව ලබා දී ඇත. එමෙන්ම තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් 119 දෙනෙකු සඳහා රු. 50,000/= බැගින් මූල්‍යාධාර ද ලබා දී ඇත. මේ වැඩසටහන යටතේ විසිතුරු මල්/ පැල ප්‍රදර්ශනයක්ද පැවැත්වීය.

#### ව්‍යාපාරයන් සඳහා තාක්ෂණික වැඩිදියුණු කිරීම්

තාක්ෂණික හුවමාරු වැඩසටහන් මෙන්ම පර්යේෂණ හා සංවර්ධන ආයතන නිරීක්ෂණය සඳහා ක්ෂෙත්‍ර චාරිකා වැඩසටහන් සංවිධානය කරන ලදී.

මේ සම්බන්ධයෙන් වැඩසටහන් නිර්මාණය කිරීමේදී මානව සම්පත් හා හැකියා වර්ධනය (ප්‍රධාන වශයෙන් තාක්ෂණික නිපුණතා), නව නිෂ්පාදන ක්‍රියාවලීන් හඳුන්වාදීම, නව යන්ත්‍ර සූත්‍ර හා උපකරණ හඳුන්වාදීම, නිෂ්පාදන සංවර්ධනය හා දිරි ගැන්වීම් සහ ඵලදායිතාවය හා ගුණාත්මකභාවය ඉහල නැංවීම යන තාක්ෂණික වර්ගීකරණයන් සඳහා ද ප්‍රමුඛත්වය ලබාදී ඇත.

කාර්මික තාක්ෂණ ආයතනය සමඟ එක්ව ඔමේගා - 03 (Omega – 03) මේද අම්ල බහුල බිත්තර නිපදවීමේ තාක්ෂණය, තෝරා ගන්නා ලද මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෙකු සඳහා ලබා දීමට මූලික පියවර ගෙන ඇත.

#### "දිරියට සවිය"

"දිරියට සවිය" ව්‍යවසායකයන් දැනුවත් කිරීමේ රූපවාහිනී වැඩසටහන යටතේ රූපවාහිනී වැඩසටහන් 06 ක් විකාශය කර ඇත.

#### "උපාධිධාරී ව්‍යාපාරික උද්‍යානය" වැඩසටහන

වයඹ විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන් 26 ක් සඳහා ව්‍යවසායකත්ව පුහුණුව ලබා දී ඇති අතර, මූල්‍යමය ආධාර ලබා දීම සඳහා 05 දෙනෙකු තෝරා ගන්නා ලදී.

#### ආනයන ආදේශන භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපෘතිය

(හඳුන්කූරු නිෂ්පාදන ව්‍යාපෘතිය)

දේශීය හඳුන්කූරු නිපදවන්නන්ගේ සංගමයක් පිහිටුවා ඇත. බදුල්ල දිස්ත්‍රික්කයේ නව හඳුන්කූරු නිෂ්පාදකයන් 28 දෙනෙකු ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇති අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණුව ලබා දී ඇත.

# පේෂකර්මාන්ත සංවර්ධන අංශය

**හැඳින්වීම**

කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පේෂකර්මාන්ත සංවර්ධන අංශයේ විෂය පථයට පහත සඳහන් කර්මාන්ත ක්ෂේත්‍ර අයත් වේ.

- අත්යන්ත්‍ර පේෂකර්මාන්තය
- බලවේග පේෂකර්මාන්තය
- ඇඟළුම් කර්මාන්තය

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

**අත්යන්ත්‍ර පේෂකර්මාන්ත අංශය**

අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයෙහි තිරසාර සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කරගෙන පිහිටුවනු ලැබූ කාර්යසාධන බලකායේ නිර්දේශයන්ට අනුව පහත සඳහන් වැඩ සටහන් 2012 වර්ෂයේ දී ක්‍රියාත්මක කර ඇති අතර, එහි ප්‍රගතිය පහත පරිදි වේ.

- **මඩම්පැල්ල අත්යන්ත්‍ර පේෂකර්මාන්ත සංවර්ධන වැඩ සටහන**

මෙම වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කරන ලද මෝස්තර සංවර්ධන පුහුණු වැඩ සටහනට සහභාගී වී සාර්ථකව පුහුණුව අවසන් කර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන පේෂ කාර්මිකාවන් 65 දෙනෙකුට අත්යන්ත්‍රය බැගින් ලබා දී ස්වයං රැකියාවක් වශයෙන් කර ගෙන යාමට අවශ්‍ය පහසුකම් සලසා දී ඇත.

- **වියන්නන් පුහුණු කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.**

පේෂකර්මාන්ත සමූපකාර සමිතිවල වියන්නන් පුහුණු කිරීම යටතේ නවක වියන්නන් 36 දෙනෙකුට පුහුණුව ලබා දී ඇත.

- **නූල් වර්ණ ගැන්වීමේ පාඨමාලා සහ වර්ණ සිද්ධාන්ත පුහුණු පාඨමාලා පැවැත්වීම.**

පළාත්සභා සහ පේෂ ගම්මාන ආශ්‍රිතව අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත පේෂකාර්මිකාවන් සඳහා නූල් සුදු කිරීම, නිමහම් කිරීම, වර්ණ ගැන්වීම හා වෝක් මුද්‍රණය කිරීම පිළිබඳ නව තාක්ෂණ ක්‍රම හඳුන්වා දී ඇත. වර්ණ සිද්ධාන්ත හා නූල් වර්ණ ගැන්වීමේ පාඨමාලා පිළිබඳ විස්තර පහත පරිදි වේ.

**නූල් වර්ණ ගැන්වීමේ පාඨමාලාවන් - 2012**

වෙන් කල මුදල රු. මි. 1.0

**වර්ණ සිද්ධාන්ත සහ නූල් වර්ණ ගැන්වීමේ පාඨමාලාවන් - 2012**

| | වැඩසටහන පැවැත්වෙන ස්ථානය | වැයවූ මුදල රුපියල් | සහභාගීත්වය |
|---|---|---|---|
| 1 | මධ්‍යම පළාත - හාරගම | 80,055.00 | 21 |
| 2 | වයඹ පළාත - පොල්ගහවෙල | 81,544.00 | 28 |
| 3 | දකුණු පළාත - මාතර | 76,599.00 | 22 |
| 4 | උතුරු මැද පළාත - පණ්ඩුලගම | 80,190.00 | 25 |
| 5 | බස්නාහිර පළාත - කඩවත | 73,840.00 | 22 |
| 6 | උතුර පළාත - චුන්නක්කම් | 85,955.00 | 26 |
| 7 | ඌව පළාත - හල්පෙ | 84,090.00 | 30 |
| | **මුළු වියදම** | **562,273.00** | **174** |

**අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදන පුහුණු පාඨමාලා - 2012**

| | පැවැත්වෙන ස්ථානය | වැයවූ මුදල රු. | සහභාගීත්වය |
|---|---|---|---|
| 1 | දිවුලපිටිය | 53,510.00 | 25 |
| 2 | තලගුණේ | 58,670.00 | 22 |
| 3 | පාලමුනායි | 80;412.00 | 21 |
| 4 | කාත්තන්කුඩි | 73.000.00 | 27 |
| 5 | අරියම්පති | 57410.00 | 25 |
| 6 | සී/ස කෑගල්ල පේෂකර්මාන්ත සමූපකාර සමිතිය | 53.035.00 | 23 |
| 7 | සී/ස කුරුණෑගල පේෂ සමූපකාර සමිතිය | 59,585.00 | 25 |
| 8 | පොළොන්නරුව බැදි | 70.032.00 | 25 |

| | | | |
|---|---|---|---|
| | වැව පේ.ෂ මධ්‍යස්ථානය | | |
| 9 | ජාඇල විද්‍යා සම්පත් මධ්‍යස්ථානය | 55,535.00 | 27 |
| 10 | වෙන්නප්පුව විද්‍යා සම්පත් මධ්‍යස්ථානය | 58,035.00 | 25 |
| | **මුළු වියදම රු.** | **619224.00** | **245** |

2012 අත්යන්ත්‍ර පේෂකර්මාන්ත සංවර්ධන වැඩසටහන යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන පුද්ගලික හා සමූපකාර අංශවල ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම සඳහා රු. මිලියන 01 ක මුදලක් වෙන් වී තිබූ අතර, ඒ සඳහා 2012.07.20 දිනැතිව ලේකම්තුමාගේ අනුමැතිය ද ලැබී තිබුණි. එම මුදල් ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් පැවැත්වීමට නියමිතව තිබූ පාඨමාලා 06 න් පාඨමාලාවන් 02 ක් පමණක් පවත්වා ඇත. ඒ පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

ජා.ව්‍ය.සං. අධිකාරිය මගින් මාතර, මැදවත්ත සමූපකාර ජාතික මණ්ඩලයේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහනේ රු. 101,392 ක බිල්පත් 2012.10.08 දිනැතිව අප වෙත එවන ලදී. එම බිල්පත්වල අඩුපාඩු තිබූ බැවින් සංශෝධනය කර එවීමට 2012.10.23 දිනැතිව ජා.ව්‍ය.සං.අධිකාරිය වෙත භාරදෙන ලදී.

**අත්යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ වැඩ සටහන**

මේ යටතේ පළාත් සභා 07 ක අත්යන්ත්‍ර 640 ක් අළුත්වැඩියා කිරීමේ වැඩ සටහන යටතේ මධ්‍යම පළාතේ අත්යන්ත්‍ර 125 ක්ද, නැගෙනහිර පළාතේ අත්යන්ත්‍ර 60 ක් සහ වයින්ඩින් 28 ක් ද, ඌව පළාතේ අත්යන්ත්‍ර 150 ක් ද, උතුරුමැද පළාතේ අත්යන්ත්‍ර 60 ක් ද අළුත්වැඩියාව සිදු කර නැවත භාවිතයට ගෙන ඇත.

**පේෂකර්මාන්ත සේවා මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීමේ වැඩසටහන**

- වයඹ පළාතේ ගොඩවෙල පේෂකර්ම සේවා මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම රු. 11,896,000 ක මුදලක් ලබා දී ඇත.
- නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ පාලමුනේ පේෂකර්ම සේවා මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම සඳහා රු. 18,000,000 ක් ලබාදී ඇත
- නල්ලූර් පේෂකර්මාන්ත මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම සඳහා රු. 410.152.48 ක් ලබා දී ඇත.
- පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ සංවර්ධන වැඩසටහන් සඳහා රු. 1,300,000 ලබාදී ඇ ත.
- කටුබැද්ද සංකීර්ණය අළුත්වැඩියාව සහ උසස් සංකීර්ණයක් දක්වා දියුණු කිරීම සිදු කර ඇත.
- පුහුණු ආයතන වල ධාරිතා සංවර්ධන වැඩසටහන සඳහා පේෂකර්ම දෙපාර්තමේන්තුවට රු. 950,000 ක් ලබා දී ඇත.
- පේෂකර්මාන්ත උපදේශිකාවන් ඉන්දියාවේ කේරළයේ පුහුණු ආයතනයක පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවීම වෙනුවෙන් රු. 3,000,000 ක් ලබා දී ඇත.
- IT software package එකක් හඳුන්වා දීම සඳහා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයට සහ පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට රු.1, 200,000.00 ක් ලබා දී ඇත.

**ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනය**

ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනයට සමගාමීව පැවැත්වෙන පළාත් ප්‍රදර්ශන සඳහා මුදල් ප්‍රතිපාදනත්, හෝටල් සඳහා සකස් කරන ලද අත්යන්ත්‍ර රෙදිපිළි සඳහා ප්‍රදර්ශන කටයුතු සංවිධානය කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත. එනම්, පළාත් ප්‍රදර්ශනය සඳහා රුපියල් මිලියන 1.8 යි. රන්සළු ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනය සඳහා රු. 2,879,289.11 ක් හා මාධ්‍ය ආයතනයට රු. 877,077/- ක් ලබා දී ඇත.

**මෝස්තර සංවර්ධනය සඳහා පරිගණක මෘදුකාංග පැකේජයක් හඳුන්වා දීම.**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය හා පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලබයි. පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට නව තාක්ෂණය හඳුන්වා දීම අරමුණු කර ගෙන මෝස්තර සංවර්ධනය සඳහා පරිගණක මෘදුකාංග පැකේජයක් හඳුන්වා දීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය වෙත ලබා දී ඇත.

**ඇඟළුම් අපනයන සේවා අංශය**

මෙරට ඇඟළුම් ආශ්‍රිත නිෂ්පාදනයන් අපනයන කිරීම සඳහා ඇඟළුම් නිෂ්පාදක අපනයන කරුවන්ට සහ ඇඟළුම් නිෂ්පාදක නොවන අපනයන කරුවන්ට අවශ්‍ය සේවා සැපයීම හා දිරි ගැන්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වේ. මේ යටතේ සිදු කර ඇති කාර්යයන් නම්,

- අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කල ඇඟළුම් හා රෙදිපිළි ආශ්‍රිත නිෂ්පාදන ආයතන සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර, අමතර කොටස් හා උපාංග හා අමුද්‍රව්‍ය ආදිය ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව හරහා තීරුබදු සහන හා පහසුකම් සලසා දීම.
- ඇගළුම් මිලදී ගැනීමේ ආයතනවල හා සම්බන්ධීකරණ කාර්යාලවල ද, ඇගළුම් නිෂ්පාදන කර්මාන්තවල ද සේවය සඳහා මෙරටට පැමිණෙන දේශීය විධායක නිලධාරීන්ට හා තාක්ෂණ ශිල්පීන්ට අවශ්‍ය නේවාසික වීසා නිර්දේශ කිරීම.
- අපනයන ඇගළුම් කර්මාන්තයට අදාල ආනයනික රෙදිපිළි උපාංග හා අමුද්‍රව්‍ය ප්‍රතිඅපනයනය හා හුවමාරු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව වෙත නිර්දේශ ලිපි නිකුත් කිරීම ද, කැමෝ රෙදි වලින් කරන ලද නිෂ්පාදනයන්ට අදාලව ආනයනයන් හා අපනයනයන් සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට නිර්දේශ ලිපි නිකුත් කිරීම.

### ඵලදායිතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන (PIP) ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය

කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලා වලට උපදේශන සේවය ලබාදීම තුලින් කර්මාන්තශාලාවල පැවැත්ම තිරසාර කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක වන මෙම වැඩසටහන සඳහා 2012 වර්ෂයේ රු.මි. 11 ඇස්තමේන්තු කර තිබූ අතර, මෙම වැඩසටහන ක්‍රියාත්මක කරමින් කර්මාන්තශාලා 10 ක ඵලදායිතාවය වර්ධනය කර ඇත.

### නිපුණතා සංවර්ධන සංවර්ධන වැඩසටහන (SME Skill Development Programme) ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය

කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තශාලාවල සේවකයින්ගේ මානව සම්පත් හා නිපුණතා සංවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන මෙම පුහුණු වැඩසටහන සඳහා 2012 වර්ෂය සඳහා ඇගළුම් ක්ෂේත්‍රයේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ඇස්තමේන්තු ගත රු.මි. 05 ක මුදල වැය කරමින් කර්මාන්තශාලා 22 ක සේවකයින් 1110 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 20 ක් පවත්වා ඇත.

### ඇඟළුම් කර්මාන්තයේ දේශීය හා අන්තර්ජාතික ප්‍රතිරූපය වර්ධනය කිරීමේ වැඩ සටහන් (JAAF)

ශ්‍රී ලංකාවේ ඇගළුම් කර්මාන්තය සම්බන්ධ වූ ඇඟළුම් නිෂ්පාදකයන්, අපනයනකරුවන්, රෙදිපිළි උපාංග නිෂ්පාදකයන්, සැපයුම්කරුවන් සහ ගැණුම්කරුවන් යන සෑම අංශයකින්ම සමන්විත ඒකාබද්ධ ඇඟළුම් සංවිධාන සංසදය ශ්‍රී ලාංකීය රෙදිපිළි හා ඇගළුම් කර්මාන්තය නියෝජනය කරන ප්‍රධාන සංවිධානය වේ. මෙම සංවිධානය හා සම්බන්ධ කර ගෙන ඇඟළුම් කර්මාන්තයේ දේශීය හා අන්තර්ජාතික ප්‍රතිරූපය වර්ධනය කිරීමට පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත.

2012 වසර සඳහා රු.මිලියන 25 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, එයින් රු. මිලියන 9.48 ක් වැය කර පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත.

1. මාර්ගගත වෙබ් අඩවි අන්තර්ජාලයේ රැඳවීමේ පහසුකම හා
2. වැඩ සටහන් හා සමුළු පැවැත්වීම
3. WWD Sourcing Summit & CEO Forum
4. Colombo Fashion Week-2012
5. එක්සත් ජනපදයේ සහ යුරෝපා සංගමය තුළ ශ්‍රී ලාංකේය ඇඟළුම්වල වෙළඳ නාමය ආරක්ෂා කිරීම
6. B2B print advertorials in WWD (US)
7. දේශීය ප්‍රතිරූපය වර්ධනය කිරීම (දැයට කිරුළ)

# පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සම්බන්ධ විෂය පළාත් සභා යටතට පැවරී ඇති විෂයකි. ඒ අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත්තේ එම විෂයට අදාල ප්‍රතිපත්තිමය තීරණ, මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂකර්මාන්ත අංශ සමඟ සම්බන්ධීකරණය තුලින් කර්මාන්තයේ දියුණුවට අදාළ සේවාවන් සැපයීමයි.

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

**ගොඩනැගිලි සහ අළුත්වැඩියා කිරීම**

ගැටඹේ, වටපුළුව, යාපනය, නල්ලූර්, හිරමඩගම, මාතලේ, කුරුණෑගල පේෂ පාසැල් හි අළුත්වැඩියා කටයුතු හා කටුබැද්ද අධ්‍යක්ෂ නිල නිවසේ විදුලි පද්ධතියේ සහ වැසිකිළි පද්ධතියේ අළුත්වැඩියා කටයුතු නිම කොට ඇත.

**අත්යන්ත්‍ර ක්ෂේත්‍රයේ පුහුණුව හා හැකියා වර්ධනය**

2012අධ්‍යයන වර්ෂයේ සිසු සිසුවියන් බඳවාගෙන අවසන් අතර ඒ අනුව අවශ්‍යතාවය පරිදි මිලදී ගැනීම සිදු කර ඇත.

පාඨමාලා සඳහා පැමිණි කටුබැද්ද, වටපුළුව, මාතර, බණ්ඩාරවෙල, කිරම, පින්නවල, සමන්තුරේ, නල්ලූර්, ගැටඹේ, බෝයගනේ, පලාපත්වල, හිරමඩගම, ශාන්තිපුර යන පේෂ පාසැල් සිසු සිසුවියන් සඳහා පැමිණීමේ දීමනා ගෙවීමට කටයුතු කර ඇත.

2011 වසරේ ජාතික ප්‍රදර්ශනය වෙනුවෙන් ගෙවිය යුතු පරිපාලන වියදම් දරා ඇත.

2012 කටුබැද්ද උසස් මෝස්තර පුහුණු පාඨමාලාවේ සිසු සිසුවියන් සඳහා පැමිණීමේ දීමනා ගෙවීම් කර ඇත.

2012 කටුබැද්ද, ගැටඹේ, වටපුළුව, නල්ලූර්, හිරමඩගම, මාතර, බණ්ඩාරවෙල, කිරම, පින්නවල, සමන්තුරේ, බෝයගනේ, පලාපත්වල, ශාන්තිපුර යන පේෂ පාසැල් සිසු සිසුවියන්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

"මූල්‍ය අධ්‍යයන" පාඨමාලා යටතේ මිලදී ගැනීම් පාඨමාලාව සඳහා පාඨමාලා ගාස්තු ගෙවීමක් කර ඇත.
පාසැල් සිසුන් සඳහා පෞරුෂත්ව වර්ධන පුහුණු පාඨමාලා පවත්වා ඇත.

රාජ්‍ය භාෂා පාඨමාලාව සඳහා නිල0ධාරීන් යොමු කිරීම හා ඒ සඳහා ගෙවීම් කිරීමට කටයුතු කර ඇත.
පේෂකර්මාන්තය ආශ්‍රිත පුහුණු පාඨමාලා යටතේ ජැකාඩ්, දුම්බර රටා, වර්ණ සංයෝජන, අන්තර් අවකාශ නිර්මාණ යන පාඨමාලා පවත්වා ඇත.

**ප්‍රවර්ධන ක්‍රියාකාරකම්**

2012 දැයට කිරුළ ජාතික වැඩසටහන යටතේ ප්‍රදර්ශනාත්මක කුටියක් පැවැත්වීම, මේ සඳහා අදාල පරිපාලන වියදම් දැරීමට කටයුතු කර ඇත.
පේෂ පාසැල් සහ ව්‍යාපෘති සඳහා අදාල අමුද්‍රව්‍ය අවශ්‍යතාවය පරිදි මිලදී ගැනීම් සිදු කර ඇති අතර ඉතිරි අවශ්‍යතාවයන් ඇණවුම් කොට ඇත.
පේෂ පාසැල් සඳහා අවශ්‍ය ගෘහ උපකරණ, අනෙකුත් උපකරණ මිලදී ගැනීමට කටයුතු කර ඇත. ඒ යටතේ පලාපත්වල, කටුබැද්ද, ගැටඹේ, බෝයගනේ, පේෂ පාසැල් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට කටයුතු කර ඇත.

**දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම්**

කටුබැද්ද සංකීර්ණයේ විදුලි පද්ධතියේ අළුත් වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස්කොට අවසන්ව ඇත, අදාල ඇණවුම් භාරදී ඇත.

කටුබැද්ද නව දේශන ශාලාව සඳහා අවශ්‍ය දේශන ශාලා පුටු මිලදී ගෙන ඇත.
ගලගෙදර ප්‍රදේශයේ තාරා අත් යන්ත්‍ර ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කොට ඇත.
2012-07-27 දින කටුබැද්ද අංශයේ නව මෝස්තර බැංකුව විවෘත කරන ලදී.
මෝස්තර බැංකුවේ ග්‍රන්ථය සකස් කොට ඇත.

පේෂකර්මාන්ත කෞතුකාගාරය ආරම්භ කොට ඇත.

**අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සඳහා අවශ්‍ය මූල්‍යමය, තාක්ෂණික හා වෙළෙඳපොල පහසුකම් සැපයීම**

ප්‍රතිලාභීන් 250ක් පුහුණුකර ඇති අතර 150ක් පමණ ස්වයං රැකියා ව්‍යාපෘති අරම්භකර ඇත. ප්‍රතිලාභීන් 300 කට පමණ මූල්‍ය හා පහසුකම් ලබාදී තිබේ.

**අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ගම්මමාන ස්ථාපිත කිරීම**

ප්‍රතිලාභීන් 100 කට අලෙවි පහසුකම් සපයා දී ඇති අතර ප්‍රතිලාභීන් 300 කට මූල්‍යමය, උපකරණ, අමුද්‍රව්‍ය සහ අනෙකුත් පහසුකම් සපයා ඇත.

**අගය එකතුකිරීම, නිෂ්පාදන විවිධාංගිකරණය සහ මෝස්තර නිර්මණ දිරිගැන්වීම.**

කටුබැද්ද මොස්තර අධ්‍යයන ඒකකය මඟින් ප්‍රචාරණය සහ නිර්මණ සකස් කිරීමේ කටයුතු සිදුකොට ඇත. මෝස්තර පුහුණු පාසල් වැඩසටහන මඟින් ප්‍රතිලාභීන් 100ක් පුහුණුකොට ඇත.

**මානව සම්පත් සංවර්ධනය**

කාර්යාල සඳහා පුහුණු පාඨමාලා 01 ක් පේෂකර්මාන්ත අංශයේ පුහුණු පාඨමාලා 03 ක් පේෂකර්ම පාසල් සිසුන් 180ක් සඳහා හා පර්යේෂණ පුහුණු වැඩසටහන් පවත්වා ඇත.

**නව තාක්ෂණ භාවිතය ඉහල නැංවීම**

වර්ණ නූල් වර්ණ ගැන්වීමේ කටයුතු ව්‍යවසායකයින් 150ක් සඳහා සේවය ලබා දී ඇති අතර ලෙෆෝ /ජැකාඩි වියමන් කැම්කාඩ්/බ්ලොක් ප්‍රින්ටින් ආදී උසස් තාක්ෂණ ක්‍රම අත්හදා බැලීම් ව්‍යවසායයන් 150ක් දක්වා වර්ධනය කර ඇත.

**වෙළෙඳපොලට පිවිසීම සඳහා අලෙවි පහසුකම් සැපයීම**

මේ යටතේ ප්‍රතිලාභීන් 50 ක් සඳහා සේවය සලසා ඇත.

**කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය**

දිවි නැගුම වැඩසටහන යටතේ උපකරණ ලබාදීම සඳහා ප්‍රතිලාභීන් 252ක් තෝරාගෙන ඇත.

# ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

## හැඳින්වීම

වසර විසිහතරකට අධික කාලයක් තුල පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයට අනුපමේය සේවාවක් සැපයූ ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය (CITI) සහ පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය (TT&SC) වර්ෂ 2009 අංක 12 දරණ පනත යටතේ, ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය (SLITA) වශයෙන් ඒකාබද්ධ කරන ලදී. එහි සේවාවන් 2009 ජුනි මස 15 වන දින සිට ක්‍රියාත්මක වන අතර මෙමඟින් මිනිස් සම්පත්, යන්ත්‍රෝපකරණ, ආයතනික ගොඩනැගිලි සහ පරිශ්‍රය කාර්යක්‍ෂමව උපයෝගි කරගෙන ඵලදායි සේවාවක් සහතික කිරීම සඳහා වූ උපායමාර්ගික තීරණය වැදගත් විය. තවද ආයතනික ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම තුළින් ව්‍යාපාරික අභියෝගයන්ට මුහුණදීමට සහ පාරිභෝගිකයා කේන්ද්‍රගත ඉහළ සේවාවන් ලබාදීම සඳහා ආයතනය ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ කළමනාකාරිත්ව ව්‍යුහය තුළින් එක් එක් අංශවල සහ පුද්ගලයින්ගේ වගකීම් සහ බලතල පැහැදිලිව නිර්වචනය කරයි.

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### පුහුණු කිරීම

පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කිරීම නිසා, වර්ෂ 2012 වසර තුල පුහුණුකිරීම් කටයුතුවල ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.

මේ යටතේ පේෂකර්ම සහ ඇඟලුම් තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 60 දෙනෙකු බඳවා ගන්නා ලදී.

කෙටිකාලීන සහතික පත්‍ර සහ ඩිප්ලෝමා මට්ටමේ පාඨමාලාවන් 14 ක් සඳහා සිසුන් සහ කර්මාන්තශාලා සේවයේ නියුතු වූවන් සහභාගී වීය.

සුළු හා මධ්‍යම කර්මාන්තකරුවන් සඳහා පාඨමාලා 17 ක් කර්මාන්තශාලා අවශ්‍යතාවයට අනුකූල වන පරිදි පැවැත්විය.

නිෂ්පාදන ඵලදායිතා වර්ධන පුහුණු වැඩසටහන් මඟින් ද සුළු හා මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්තශාලා 11 ක මධ්‍යම කළමනාකරණ කටයුතුවල නියුතු වූවන් සඳහා වූ විශේෂ පාඨමාලා පවත්වා ඒ තුළින් ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා දායකත්වය ලබා දී ඇත.

### පර්යේෂණාගාර සේවා

2012 වසර සඳහා ලිමිටඩ් බ්‍රෑන්ඩ් ප්‍රතීතන සහතිකය සඳහා ඉන්දියාවේ ඉන්ටර්ටෙක් ලිමිටඩ් ආයතනයේ උපදේශනය සහ සේවය ලබාගන්නා ලදී.

පර්යේෂණාගාරයේ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකු ඉන්දියාවේ ඉන්ටර්ටෙක් ඉන්දියා පුද්ගලික සමාගම නමැති ආයතනයේ පුහුණුව සඳහා අනුයුක්ත කර ඇත.

### උපදේශන සේවා සැපයීම

දකුණු පළාතේ ග්‍රාමීය විවීම් අංශවලට ප්‍රයෝජනවත් වන පරිදි වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා යෝජනාවලියක් ඉදිරිපත් කර ඇත.

### ඵලදායිතා වර්ධන වැඩසටහන

කුඩා හා මධ්‍යම කර්මාන්තශාලාවලට සඳහා උපදේශන සේවය ලබාදීම සිදු කර ඇත.

මෙම වැඩසටහන සඳහා නව කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්තශාලා පහක් තෝරාගෙන ඇත.

වැඩසටහන සඳහා රුපියල් මිලියන 11 ක මුදලක් මෙම අමාත්‍යාංශය මඟින් ලබා දී ඇති අතර, එමඟින් 2012 වසර තුලදී කර්මාන්තශාලා 11 ක් සඳහා උපදේශන සේවා ලබා දී ඇත.

### ඇඟලුම් ක්ෂෙත්‍රයේ කුඩා හා මධ්‍යම කර්මාන්ත සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන

මේ යටතේ පුහුණු පාඨමාලා 20 ක් පවත්වා ඇති අතර ආයතනය තුළ සහ කර්මාන්තශාලා තුල ඇස්තමේන්තුගත පුහුණු වැඩසටහන් 17ක් පැවැත්වා ඇත.

කර්මාන්තශාලාවල රැකියාවල නිරතවූවන් 459 ක් පුහුණු කරන ලද අතර අමාත්‍යාංශය මඟින් 2012 වසර සඳහා රු. මිලියන 5ක් වෙන්කර ඇති අතර 2012 වසරේ දී රු. මිලියන 4 ක් වැය කර ඇත.

### සම්භාණ්ඩ හා පාවහන් නිෂ්පාදන පුහුණුකිරීමේ සංවර්ධන වැඩසටහන

සම්භාණ්ඩ සහ පාවහන් උපදේශන මණ්ඩලය සහ මෙම අමාත්‍යාංශය එක්ව සම්භාණ්ඩ සහ පාවහන් අංශය සඳහා කෙටිකාලීන පාඨමාලාවක් 2012 වසරේ දී ආරම්භ කරන ලදී.

# වාණිජ අංශය

# වාණිජ දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

රටේ සමස්ත නිෂ්පාදනය, ආදායම සහ රැකියා අවස්ථා වැඩිකිරීම තුලින් සහ එමගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික වර්ධනයට දායකත්වයක් ලබාදෙමින් ජනජීවිතයේ ගුණාත්මක බව ඉහල නංවා හොඳ ජීවන මට්ටමක් ජනතාවට ලබාදීමේ අරමුණ පෙරදැරි කරගෙන රජයේ වෙළඳ ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික මට්ටමේ විදේශ වෙළඳ සබඳතා ප්‍රවර්ධනය කොට වැඩිදියුණු කිරීම මෙම දෙපාර්තමේන්තුව යටතේ සිදුවේ.

වාණිජ දෙපාර්තමේන්තුව, බහුපාර්ශ්වික වෙළඳ කටයුතු, ද්විපාර්ශ්වික වෙළඳ සබඳතා, කලාපීය සහයෝගීතාව සහ වෙළඳ ප්‍රවර්ධනය යන අංශ හතරකින් සමන්විතවේ.

### 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

➢ **බහුපාර්ශ්වික වෙළඳ කටයුතු**

- **ලෝක වෙළඳ සංවිධානය** (WTO)

ලෝක වෙළඳ සංවිධානය හා ඒ හා සම්බන්ධව ශ්‍රී ලංකාව තුළ සිදුවන කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකරන ප්‍රධානතම ජාතික ආයතනය ලෙස වාණිජ දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

මෙහිදී අඩු මිලට විකුණන සහ සහනාධාරලත් අපනයන සම්බන්ධයෙන් ක්‍රියාකිරීම උදෙසා ජාතිකමය නීති පද්ධතියක් කෙටුම්පත් කිරීම සිදුවේ.

- **ගෝලීය වෙළඳ වරණ ක්‍රමය (GSTP)**

ගෝලීය වෙළඳ වරණ ක්‍රමයේ තෙවන වටයෙහි සාකච්ඡා සම්මුතිවලට ශ්‍රී ලංකාව සහභාගී විය.

➢ **කලාපීය සහයෝගීතාව**

- **දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)**
  - දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ විශේෂඥ කමිටුවේ (SCOE) හත්වැනි සභාවාරය පවත්වන ලදී.
  - දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමේ අමාත්‍ය සභාවේ හයවැනි සභාවාරය පවත්වන ලදී.
  - සාර්ක් නිදහස් වෙළඳ ගිවිසුම (III වන අදියර) යටතේ සංවේදී අයිතම ලැයිස්තු අඩුකිරීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ පළමු සභාවාරය, 2012 ජුනි 18, නේපාලයේ කත්මණ්ඩු වල දී පවත්වන ලදී.

- **සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුම (SATIS)**

සේවා වෙළඳාම පිළිබඳ සාර්ක් ගිවිසුමේ විශේෂඥ කණ්ඩායමේ සභාවාර තුනක් පවත්වන ලදී.

- **ආසියා - පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA)**

2012 මෙම වෙළඳ ගිවිසුම යටතේ චීනය වෙත ශ්‍රී ලංකාවේ අපනයන ඇමෙරිකානු ඩොලර් මිලියන 37ක් පමණ වූ අතර එම අපනයනයන්ගෙන් බහුතරය වූයේ කොහු කෙඳිය. තේ, මාළු සහ ඇඟලුම් අනෙකුත් නිෂ්පාදනයන්ට ඇතුළත් වූහ.

➢ **ද්විපාර්ශ්වික වෙළඳ සබඳතා**

- **ඉන්දු -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම(ISFTA)**

2012 කාල පරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 566 ක්වූ ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත කරන ලද අපනයන ප්‍රමාණය, 2011 වසරේ අදාල කාල පරිච්ඡේදය තුල වාර්තා වූ ඇ.ඩො. මිලියන 522 හා සසඳන විට 8.6% ක වර්ධනයක් සනිටුහන් කර ඇත.

2012 වසරේ ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබ ඇති මුළු ප්‍රභවස්ථාන සහතික සංඛ්‍යාව 9,742 කි.

- **පාකිස්ථාන – ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම(PSFTA)**

පාකිස්ථානය සඳහා ශ්‍රී ලංකාවේ අපනයන නැවතත් එහි ගාමක බලය ලබාගනිමින් 2012 වර්ෂයේ දී 10%ක වර්ධනයක් පෙන්වමින් ඇමෙරිකානු ඩොලර් මිලියන 82.75ක් දක්වා වැඩිවී ඇත. පාකිස්ථානය, සාර්ක් කලාපය තුල ඉන්දියාවට පසුව ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වෙළඳ හවුල්කරු වේ.

- **ශ්‍රී ලංකාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය අතර වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ මූලික ගිවිසුම(TIFA)**

එක්සත් වෙළඳාම සහ ආයෝජනය පිළිබඳ මූලික ගිවිසුම යටතේ ඒකාබද්ධ කවුන්සිලයේ 10වන රැස්වීම 2012 පෙබරවාරි 27වන දින ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී.

- **බංගලාදේශය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසමේ 4 වැනි සැසිවාරය**

බංගලාදේශය සහ ශ්‍රී ලංකාව අතර ආර්ථික සහයෝගීතාව පිළිබඳ ඒකාබද්ධ කොමිසමේ 4වැනි සැසිවාරය 2012 මාර්තු 7 සිට 8 දක්වා බංග්ලාදේශයේ ඩකා හි දී පවත්වන ලදී. ද්විපාර්ශ්වික වෙළඳ සහ ආර්ථික සබඳතා සඳහා වන අවස්ථාවන් පිළිබඳව මෙන්ම සම්බාධක පිළිබඳවත් මෙම සභාවාරයේ දී සාකච්ඡාවට භාජනය කරන ලදී.

- **ශ්‍රීලංකාව සහ යුක්‍රේනය අතර වෙළඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ අන්තර් රාජ්‍ය ඒකාබද්ධ කොමිසමක් පිහිටුවීම**

වෙළඳ හා ආර්ථික සහයෝගීතාව පිළිබඳ අන්තර් රාජ්‍ය ඒකාබද්ධ කොමිසමක් පිහිටුවීම පිළිබඳ ශ්‍රී ලංකාවේ සහ යුක්‍රේනයේ රජයන් අතර ගිවිසුම් කෙටුම්පත සම්බන්ධයෙන් සවිස්තරාත්මක සාකච්ඡාවන් සඳහා ශ්‍රී ලංකාවේ සහ යුක්‍රේනයේ දූත පිරිස් 2012 මැයි 22 කොළඹ දී හමුවූහ.

- **සංචාරක සීෂෙල්ස් ව්‍යාපාරික දූත පිරිස සමඟ ව්‍යාපාරික හමුව**

සීෂෙල්ස් හි අතිගරු ජනාධිපති ජේම්ස් ඇලික්ස් මයිකල් මහතා ව්‍යාපාරික දූත පිරිසක් කැටුව 2012 අගෝස්තු 20 සිට 23 දක්වා ශ්‍රී ලංකාව වෙත නිල සංචාරයක යෙදුණි.මෙම අවස්ථාවේ දී, ශ්‍රී ලංකාව සහ සීෂෙල්ස් වෙත අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභී වන වාණිජමය සහ ආර්ථිකමය වාසි සහගත ක්ෂේත්‍ර පිළිබඳව අදහස් හුවමාරු කරගැනීමට පහසුකම් සැලසීමේ අරමුණින් යුතුව, වාණිජ දෙපාර්තමේන්තුව විසින් සංචාරක දූත පිරිස සමඟ ව්‍යාපාරික හමුවක් සංවිධානය කරන ලදී.

- **සංචාරක ස්වාසිලන්ත ව්‍යාපාරික දූත පිරිස සමඟ ව්‍යාපාරික හමුව**

ස්වාසිලන්තයේ රාජාභිනායකතුමාගේ නිල සංචාරක දූතපිරිස සහ රාජ්‍ය නිලධාරීන්, පෞද්ගලික අංශයේ සමාගම් සහ ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩලය සමඟ අන්තර් ක්‍රියාකාරී සැසිවාරයක් සංවිධානය කරන ලදී.

➢ **වැඩමුළු සංවිධානය කිරීම**

- ආයෝජන මණ්ඩලයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීමේ අදහසින් යුතුව වාණිජ දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අධ්‍යාපන වැඩසටහනක් පවත්වන ලදී.
- සුළු අපනයන බෝග අපනයනකරුවන් දැනුවත් කිරීම සඳහා වන වැඩමුළුවක් පවත්වා ඇති අතර එම

වැඩමුළුව සුළු අපනයන බෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් වාණිජ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව සංවිධානය කරන ලදී.

- **වෙළඳ ප්‍රදර්ශන සහභාගීත්වය**
  - **එක්ස්පෝ 2012 ප්‍රදර්ශනය**
    2012වසරේදී එක්ස්පෝ වෙළඳ ප්‍රදර්ශනය සාර්ථක අයුරින් පැවැත්වීම සඳහා දායකත්වය සපයන ලදී.
  - **දැයට කිරුළ 2012**
    අනුරාධපුරයේ ඔයාමඩුවේ දී පවත්වන ලද "දැයට කිරුළ 2012" ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සඳහා සහභාගී වන ලදී.

- **වෙළඳ ප්‍රවර්ධනය**
  - වරණීය ගිවිසුම්, කලාපීය ගිවිසුම් සහ ද්විපාර්ශ්වික ගිවිසුම් යටතේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් 2012 කාල පරිච්ඡේදය සඳහා ප්‍රභවස්ථාන සහතික 113,886නිකුත් කරන ලදී.
  - 2012 වසරේ දී, දෙපාර්තමේන්තුව විසින් විවිධ ජාතීන් සඳහා නේවාසික වීසා බලපත්‍ර සඳහා නිර්දේශ 211ක් නිකුත් කරන ලදී.
  - විදෙස් රටවල සේවය නියුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රවර්ධනය, ආයෝජන ප්‍රවර්ධනය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සහ අනෙකුත් ආර්ථික කටයුතු ප්‍රවර්ධනය සඳහා කටයුතු කිරීම.

# සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

සමාගම් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදුකිරීම සඳහා වෙනම ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීමෙන් අනතුරුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මේ වන විට වසර 60ක් සම්පූර්ණ කර ඇති අතර 1861 සිට සමාගම්වලට අදාලව පනවන ලද ආඥාපනත් සහ පනත් ක්‍රියාත්මක කරමින් දීපව්‍යාප්ත සේවාවක් සපයනු ලබයි. වෙනත් ව්‍යවස්ථා මඟින් දෙපාර්තමේන්තුවට පැවරී ඇති සහ සමාගම් පනතේ අධීක්ෂණ හා නියාමන බලතල ක්‍රියාත්මක කරමින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා එහි ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි.

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

### සමිති ආඥා පනත - 123 වන අධිකාරිය

ආඥා පනත යටතේ සමිති ලියාපදිංචි කිරීම සහ මෙරට දැනට ලියාපදිංචි සමිති නියාමනය කිරීම මේ මගින් සිදු වේ. 2012 වසර තුළදී සමිති 679 ක් ලියාපදිංචි කරන ලදී.

### 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත

මෙම පනත 1987 දී හඳුන්වා දී ඇත. 2012 වසර තුළදි පොදු කොන්ත්‍රාත් අයදුම්පත් 4414 ක් ලියාපදිංචි කර ඇත.

### අංශ සහ ඒවායේ ක්‍රියාකාරීත්වය

- නම් අනුමත කිරීම සහ නව සමාගම් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2012 වසරේ ලියාපදිංචි සමාගම් සංඛ්‍යාව 7312 කි.

**2012 වසර තුළදී විසුරුවා හැර ඇති සහ අවලංගු කර ඇති සමාගම් සංඛ්‍යාව**

| ක්‍රියාකාරකම | සමාගම් සංඛ්‍යාව |
|---|---|
| සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ඈවර කිරීම | 62 |
| ණය ගැතියන් ස්වේච්ඡාවෙන් ඈවර කිරීම | 09 |
| අධිකරණයෙන් ඈවර කිරීම | 05 |
| පනතේ 394 යටතේ නම කපාහැරීම | 439 |
| මිශ්‍ර කිරීම හේතුවෙන් නම කපාහැරීම (245 වගන්තිය) | 35 |
| **එකතුව** | **550** |

මූලාශ්‍රය:- සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

### නඩු පැවරීමේ අංශය

2012 වර්ෂයේදී අලුතින් නඩු පැවරීම් 30 ක් සිදුකර ඇත. ඊට අමතරව සිදුකරන ලද වැරදි 1297 ක් නඩු පැවරීමෙන් තොරව සමථයට පත්කර ඇත. වැරදි සමථයට පත් කිරීම මගින් දෙපාර්තමේන්තුව ලබා ඇති අදායම රු.මි. 4.10 කි.

### ගිණුම් හා ආයතන අංශය

2012 වසර වන විට දෙපාර්තමේන්තුවේ සමස්ථ ආදායම රුපියල් මිලියන 376 ක් වන අතර සමස්ථ වියදම රුපියල් මිලියන 58 කි.

# ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

### හැඳින්වීම

1860 දී ආරම්භ වූ ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපල ක්‍රමය වර්තමානයේ දී පාලනය කෙරෙනුයේ 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත මඟිනි. බුද්ධිමය දේපල පනත මගින් පේටන්ට් බලපත්‍ර, වෙළඳ ලකුණු, කාර්මික සැලසුම්, අසාධාරණ තරඟකාරීත්වය, සංයුක්ත පරිපථවල පිරිසැලසුම් නිර්මාණ ,ප්‍රකාශන හිමිකම් හා සම්බන්ධ අයිතිවාසිකම් වැනි බුද්ධිමය දේපල පිළිබඳ විවිධ ක්ෂෙත්‍රයන් ආවරණය කෙරෙන අතරම බුද්ධිමය දේපල අයිතිවාසිකම් පරිපාලනය සහ බලාත්මක කිරීම පිළිබඳ ප්‍රතිපාදන ද සැපයේ. ශ්‍රී ලංකාව බුද්ධිමය දේපල පිළිබඳ ප්‍රධාන ජාත්‍යන්තර සම්මුතීන් වනශාස්ත්‍රීය හා කලාත්මක නිර්මාණ ආරක්ෂා කිරීම සඳහාවූ බර්න් සම්මුතිය, කාර්මික දේපල ආරක්ෂා කිරීම සඳහා වූ පැරිස් සම්මුතිය, පේටන්ට් සහයෝගීතා ගිවිසුම, වෙළඳ ලකුණු නීති ගිවිසුම, ප්‍රකාශන අයිතිය පිළිබඳ විශ්ව සම්මුතිය සහ වෙළඳාම සම්බන්ධ බුද්ධිමය දේපල පිළිබඳ ගිවිසුම යනාදියෙහි සාමාජිකත්වය දරයි.

### 2012දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

- **පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්**

යටතේ පුහුණු වැඩසටහන් 07 පවත්වා ඇත.

### අයදුම් පත් සහ ඉටුකල කාර්යයන් පිළිබඳ ප්‍රගතිය

### නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර

මෙම කාර්යාලය විසින් දේශීය හා විදේශීය පේටන්ට් බලපත්‍ර අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම් ලබන නව නිපැයුම් වලට පේටන්ට් ආරක්ෂාව ප්‍රදානය කරනු ලැබේ. එසේ පේටන්ට් බලපත්‍ර ප්‍රධානය කිරීමෙන් අනතුරුව ඊට අදාල අලුත්කිරීම්, පැවරීම් සහ අවසර ගිවිසුම් යනාදී විවිධ අංගයන් ද මෙම කාර්යාලය විසින් පරිපාලනය කරනු ලැබේ.

| ක්‍රියාකාරකම | 2012.12.31දක්වා | |
|---|---|---|
| | අයදුම්පත් ලැබීම් | නිමකළ සංඛ්‍යාව |
| පේටන්ට්ප්‍රදාන | 539 | 126 |
| අලුත් කිරීම් | 540 | 502 |
| ලේඛනපිටපත් | 52 | 52 |
| පැවරීම් | 24 | 24 |
| පූර්වකලා නිර්මාණ පිළිබඳ පිරික්සුම් වාර්තා | - | 112 |
| මහජන පිරික්සුම් | - | 52 |
| සංශෝධන | 48 | 18 |
| ලැබුනුබවදැන්වීම් | - | 137 |
| වර්ගීකරණය | - | 49 |
| ගැසට්නිවේදන | - | 46 |
| | - | 1000 |
| මූලිකපරීක්ෂා | - | 315 |
| දත්ත ඇතුළත් කිරීමහාවලංගු කිරීම | - | 628 |

මූලාශ්‍රය:- 2012 ප්‍රගති වාර්තාව

- **වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමට**

ලියාපදිංචි කිරීමට අයදුම්කර ඇති වෙළෙඳ ලකුණු, සේවා ලකුණු, සාමූහික ලකුණු සහ සහතික ලකුණු යන ලකුණුවල කාර්ය පටිපාටි, හරය සහ නෛතිකභාවය පිළිබඳව පරීක්ෂා කර බලා සුදුසුකම් ලැබූ ඒවා ලියාපදිංචි කිරීම මෙම කාර්යාලය මඟින් සිදු කෙරේ. තවද ලියාපදිංචි කරන ලද ලකුණු හා සම්බන්ධව අලුත් කිරීම්, පැවරීම් සහ අවසර ගිවිසුම් පිළිබඳ පරිපාලනමය කටයුතු ද ලකුණු හා සම්බන්ධ තොරතුරු රැස්කර ප්‍රචලිත කිරීම ද සිදුවේ.

| ක්‍රියාකාරකම | 2012.12.31දක්වා | |
|---|---|---|
| | අයදුම්පත් ලැබීම් | නිමකළසංඛ්‍යාව |
| අයදුම්පත් ලියාපදිංචි කිරීම | 9116 | 1349 |
| අලුත් කිරීම් | 2477 | 1372 |
| වෙනස් කිරීම් | 1640 | 1243 |
| පැවරීම් | 611 | 404 |
| අවසර ගිවිසුම් | 4 | 138 |
| ඒකපාර්ශ්වික විභාග | 277 | 835 |
| විරුද්ධ පාර්ශ්වික විභාග | 40 | 78 |
| පිරික්සුම් වාර්තා | - | 3037 |
| අත්හැර දැමීම් | - | 237 |
| ඉවත් කිරීම සඳහා නියෝග | - | 100 |

| | | |
|---|---|---|
| ගැසට් නිවේදන | 2565 | 2458 |
| වියානා වර්ගීකරණය | - | 781 |
| විවිධ | - | 12630 |

මූලාශ්‍රය:- 2012 ප්‍රගති වාර්තාව

- **කාර්මික සැලසුම්**

කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම් ලත් අයදුම්පත් ලියා පදිංචි කිරීම මෙම කාර්යාලය මඟින් සිදුකරන අතර අලුත් කිරීම්, පැවරීම් සහ අවසර ගිවිසුම් ඇතුලු ලියාපදිංචි කිරීමෙන් පසුව සිදුකරන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද කටයුතු කරයි. කාර්මික සැලසුම් හා සම්බන්ධ තොරතුරු එක්රැස් කොට බෙදාහැරීම ද මෙම කාර්යාලය මඟින් සිදුකරනු ලැබේ.

| ක්‍රියාකාරකම | 2012.12.31දක්වා | |
|---|---|---|
| | ලැබූ අයදුම් පත් සංඛ්‍යාව | නිම කළ සංඛ්‍යාව |
| ලියාපදිංචි කිරීම | 394 | 88 |
| අලුත් කිරීම් | 59 | 26 |
| ලේඛන පිටපත් | 17 | 17 |
| පැවරීම් | 2 | 4 |
| වර්ගීකරණය | - | 286 |
| විවිධ | - | 422 |
| ගැසට් නිවේදන | 58 | 58 |
| දත්ත ඇතුලත් කිරීම | - | 390 |
| වලංගු කිරීම | - | 122 |
| මූලික පරීක්ෂා | - | 139 |

මූලාශ්‍රය:- 2012 ප්‍රගති වාර්තාව

**යටිතල පහසුකම් සංවර්ධනය**

මෙහිදී මූලික අවධානය යොමු වූයේ බුද්ධිමය දේපල පරිපාලනය පරිගණක ගත කිරීම කෙරෙහි මේ වන විට වෙළෙඳ ලකුණු, පේටන්ට් හා කාර්මික සැලසුම් පිළිබඳ පරිගණක පද්ධතිය පූර්ණ ලෙස ක්‍රියාත්මක වේ.

බුද්ධිමය පේටන්ට් හා කාර්මික සැලසුම් පිළිබඳ පරිගණක පද්ධතිය පූර්ණ ලෙස ක්‍රියාත්මක වේ. බුද්ධිමය දේපල පරිගණක පද්ධතියේ නව තම සංස්කරණයක් ස්ථාපනය කරන ලදී.

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**හැඳින්වීම**

1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනයේ නියැලී ප්‍රධානතම රාජ්‍ය ආයතනයයි.

**අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්යය භාරය සහ විෂය පථය**

ශ්‍රී ලංකාවේ අපනයන සංවර්ධනයේ දී මණ්ඩලය සතු කාර්යය භාරය සහ විෂය පථය, මණ්ඩලයේ උපාය මාර්ගික සැලැස්මේ පැහැදිලිව හඳුනාගෙන ඇත. ඒ අනුව ප්‍රතිපත්ති උපදේශක, පසු විපරම්කරු, ප්‍රවර්ධක සහායක, පහසුකම් සපයන්නා සහ දැනුම ලබා දෙන්නා යනුවෙන් ප්‍රධාන භූමිකා 5 ක් යටතේ මණ්ඩලය අපනයන ක්ෂේත්‍රයේ කටයුතුවල නියැලේ.

මෙම සැලැස්ම අනුව යමින් අපනයන අංශ ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා වූ වැඩසටහන් පෙළක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් අපනයනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම, ජාත්‍යන්තර වෙළෙඳපල අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස නිෂ්පාදන හා සේවාවන් වැඩි දියුණු කිරීම, අපනයනකරුවන් වෙත වෙළෙඳපල හඳුනාගැනීම, ප්‍රවේශවීම, සංවර්ධනය සහ විවිධාංගීකරණය සඳහා විශේෂඥ සේවාවන් සැපයීම, සැපයුම් දාමය වැඩි දියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රාදේශීය මට්ටමේ අපනයනයේ නැඹුරු සුළු හා මධ්‍ය ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම යනාදී ප්‍රධාන අරමුණු රාශියකින් සමන්විත වේ.

## 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

**අපනයන සංවර්ධන මණ්ඩලය උපාය මාර්ගික සැලැස්ම 2012 - 2016**

මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව යමින් 2015 දී ඇ.ඩො.බි. 15 ක් වූ අපනයන ආදායම් ඉලක්කය සපුරාගැනීම සඳහා 2012 -2016 උපාය මාර්ගික සැලැස්ම යාවත් කාලීන කර ඇත.

**අපනයන සංවර්ධන පනත යටතේ උපදේශක සභා පිහිටුවීම.**

අපනයනකරුවන් ගේ ගැටළු නිරාකරණය කිරීමේ සහ භාණ්ඩ හා සේවා අපනයන ඉලක්ක සපුරා ගැනීමේ අරමුණින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන් නියෝජනය වන පරිදි උපදේශක සභා 26 ක් පිහිටුවීමට කටයුතු කර ඇත.

**අපනයනකරුවන්ගේ සංසදය** :Exporters Forum-

කර්මාන්ත හා වාණිජ කටයුතු ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අපනයනකරුවන්ගේ සංසද දෙකක් පැවැත්වූ අතර ගැටළු 43 ක් සාකච්ඡා කර ඇත

**කෘෂිකාර්මික කෘෂිකාර්මිකෘෂි කාර්මික, ධීවර, කාර්මික නිෂ්පාදන සහ අපනයන සේවා අංශ සංවර්ධනය**

- ඇඟළුම් නිෂ්පාදන,මැණික් සහ ස්වර්ණාභරණ, ත්‍යාග භාණ්ඩ, පාවහන් යන ආදී අංශයන් සඳහා මෝස්තර සංවර්ධන වැඩසටහන පවත්වා ඇති අතර සුළු හා මධ්‍ය පරිමාණ ඇඟළුම් නිෂ්පාදකයන්ගේ තාක්ෂණ සංවර්ධන වැඩසටහනක් ද පවත්වා ඇත.
- සේවා අංශයේ අපනයන ආදායම ලබාගැනීම සඳහා සමීක්ෂණයක් පවත්වා ඇත.
- විද්‍යුත් මාධ්‍යයෙන් ශ්‍රී ලාංකීය තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය ප්‍රචාරණය කර ඇත.
- විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් සඳහා නිරෝධායන/ රඳවා තබාගැනීමේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ද සහාය වී ඇත.
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල ආනයන ප්‍රවර්ධනය කිරීමේ නිරත වන නෙදර්ලන්ත CBI ආයතනයේ සහභාගීත්වයෙන් "අක්වෙරළ මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘති කළමණාකරණය" මැයෙන් දෙදින වැඩමුළුවක් අගෝස්තු 28, 29 දී පවත්වන ලදී.

**අගය එකතු කිරීම දිරිගැන්වීම මඟින් සම්ප්‍රදායික අපනයන භාණ්ඩ කිහිපයක් මත රැඳියාව අවම කිරීම**

- කුරුඳු බේල් වෙනුවට කුරුඳු ආශ්‍රිතව නිෂ්පාදනය කරනු ලබන කුරුඳු පෙති, සුවඳ විලවුන් ආදී නිෂ්පාදන වෙළඳපලට හඳුන්වා දී ඇත.
- ශ්‍රී ලාංකිය කුරුඳු ජාත්‍යන්තර වෙළෙඳපල තුල සන්නාම්කරණය කිරීමට පියවර ගැනීම. මෙම සන්නාම යුරෝපා සංගමයේ සහ ඇ.එ.ජ. යේ ලියාපදිංචි කිරීම සිදුකර ඇති අතර අනෙකුත් තරඟකාරී වෙළඳපලවල් වන මෙක්සිකෝ, කොලොම්බියා, පීරු යන රටවල ද ලියාපදිංචි කිරීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී.

- දකුණු පලාතේ සෞඛ්‍යාරක්ෂිත ක්‍රම (GMP) භාවිතා කරන කුරුඳු සැකසුම් මධ්‍යස්ථාන 15 ක් ආරම්භ කර ඇත.
- ශ්‍රී ලංකා බිලූ සෆායි Ceylon Sapphire සන්නම ප්‍රවර්ධනය කිරීම සඳහා රාජකීය විවාහයට සමගාමීව වෙබ් අඩවියක් දියත් කිරීම සිදුකර ඇත.

### නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධනය

- ජාත්‍යන්තර වෙළඳපලට පිවිසීම සඳහා අපනයනකරුවන්ට පහසුකම් සැලසීම.
  අන්තර් ජාතික වෙළඳ ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගි කරවීමට පියවර ගෙන ඇත. මේ යටතේ පවත්වා ඇති ප්‍රදර්ශන
  - යුරෝපා වෙළඳ ප්‍රදර්ශන 07
  - ආසියා කලාපය ප්‍රදර්ශන 11
  - ඇමරිකා කලාපය ප්‍රදර්ශන 01
  - මැද පෙරදිග ප්‍රදර්ශන 03
- අභ්‍යන්තර හා බාහිර දූත මණ්ඩල සංවිධානය කර ඇත.
- "ආසියාවේ කේන්ද්‍රය හා අත්වැල් බැඳගනිමු" යන තේමාවෙන් 2012 මාර්තු 28 සිට 31 දක්වා පැවති "ශ්‍රී ලංකා එක්ස්පෝ - 2012 " දැවැන්ත අන්තර්ජාතික වෙළෙඳ, ආයෝජන සහ සංචාරක ප්‍රවර්ධන ප්‍රදර්ශනය සියලු ඉලක්ක අභිබවමින් සාර්ථක විය. "ශ්‍රී ලංකා එක්ස්පෝ - 2012" යනු අන්තර්ජාතික ප්‍රදර්ශනයක්, ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයක්, ව්‍යාපාරික හමුවීම්, සම්මන්ත්‍රණ, සංස්කෘතික සංදර්ශනයක් සහ මෝස්තර දැක්මක් යනාදී අනන්‍ය වැඩ සටහන් රාශියක එකතුවකි.

- අන්තර් ජාතික මට්ටමේ දේශිය වෙළෙඳ ප්‍රදර්ශන පවත්වා ඇත.
  - පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය
    මෙම ප්‍රදර්ශනය හතරවන වරටත් පැවැත්වූ අතර වෙළඳ කුටි 200 කට අධික ප්‍රමාණයකින් සමන්විත විය. මීට අමතරව වෙළඳ කුටි 24 කින් සමන්විත විශේෂ මණ්ඩපයක් ඉන්දියානු පාවහන් කොටස් නිෂ්පාදකයන්ට ලබා දී තිබූ අතර තවත් විශේෂ මණ්ඩපයක් ශ්‍රී ලාංකිය සුළු හා මධ්‍ය පරිමාණ පාවහන් නිෂ්පාදකයන්ට වෙන්කර තිබිණි.

  - බෝට්ටු ප්‍රදර්ශනය 2012
    ප්‍රදර්ශනයේ දී නවීනතම නිෂ්පාදන සහ නව මෝස්තර ඉදිරිපත් කෙරිණි. මෙය යුරෝපා වෙළඳපලෙන් බැහැරව ඉන්දියාව පකිස්ථානය බංගලාදේශය හා මැද පෙරදිග රටවල වෙළඳපල කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙමින් පැවැත් විණි.

- නව වෙළෙඳපල අවස්ථා හඳුනා ගැනීම සහ ඒ සඳහා ප්‍රවිෂ්ය වීම
  මෙ යටතේ සම්ප්‍රදායික වෙළඳපල මත රැඳියාව අවම කිරීම සඳහා නැගී එන වෙළඳපලවල අපනයන ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇත.

### ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන්

- අපනයන ආදායමට සුලු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන්ගේ දායකත්වය ඉහල නැංවීම සඳහා අපනයනයේ ප්‍රතිලාභ ප්‍රාදේශීය මට්ටමට ගලා සැලැස්වීම.
  - කෘෂි අපනයන කලාප තවදුරටත් ව්‍යාප්ත කිරීමට පියවර ගෙන ඇත.
    බිංගිරිය සහ උඩුබද්දාව ප්‍රදේශ ආවරණය වන පරිදි ඇන්තූරියම් සහ කැපූ මල් වගා කිරීමේ කටයුතු සඳහා දැල් ගෘහ 100 ක් සහ කැපූ මල් දැල් ගෘහ 100 ක් ක්‍රියාත්මක වන අතර ඒවායේ නිෂ්පාදන අපනයනය ද ආරම්භ කර ඇත. එසේම බිංගිරිය මල් වසන්තය ප්‍රදර්ශනය දෙවන වරට පවත්වන ලදී.

  - පොළොන්නරුව විසිතුරු මසුන් බෝ කිරීමේ ව්‍යාපෘතිය
    මෙම ව්‍යාපෘතිය පළමු හා දෙවන අදියරයන් යටතේ තෝරා ගත් ප්‍රතිලාභීන් 100 කට අවශ්‍ය ආම්පන්න බෙදා දී ඇති අතර තෙවන අදියර යටතේ තෝරා ගත් ප්‍රතිලාභීන් 123 කට රු. මිලියන 7.3 ක වටිනාකමින් යුත් උපකරණ බෙදා දී ඇත.

- දකුණු පලාත
  - ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක සඳහා තත්ත්ව සහතික ලබා දී ඇත.
  - සුදුසු සැපයුම් මධ්‍යස්ථාන සඳහා මූල්‍ය හා තාක්ෂණ සහාය ලබා දී ඇත.
  - දකුණු පලාතේ රබර් ආශ්‍රිත නිෂ්පාදකයන්ට විදේශීය වෙළෙඳපලට පිවිසීමට සහාය ලබා දී ඇත.
  - ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වල කුඩා හා මධ්‍ය පරිමාණ මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදකයන් සඳහා තත්ත්වය හා වෙළඳපොල සංවර්ධන වැඩසටහන පවත්වා ඇති අතර අපනයනය සඳහා වාණිජමය විසිතුරු පැල වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහ අලෙවිකරණ වැඩ සටහන් ද පවත්වන ලදී.
  - තිස්සමහාරාම අපනයන නිෂ්පාදන ගම්මාන සමාගම සඳහා උපදේශකත්වය සැපයීම සහ වැඩ කටයුතු ඉදිරියට කර ගෙන යාමට පහසුකම් සපයා ඇත.
  - හම්බන්තොට දිස්ත්‍රික්කයේ අගය එකතුකල කොහු ආශ්‍රිත නිෂ්පාදන සඳහා වැඩසටහන් පවත්වා ඇත.
  - අපනයන සංවර්ධන මණ්ඩලය, රුහුණු විශ්ව විද්‍යාලීය කෘෂිකර්ම පීඨය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ එක්ව මාතර දිස්ත්‍රික්කයේ ගොවීන් 40 ක් පමණ සහභාගී කරවා ගෙන අක්කර 20 ක භූමි ප්‍රමාණයක

අන්නාසි වගාව සඳහා නියමු ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. මාතර දිස්ත්‍රික්කයේ අපනයනය සඳහා අන්නාසි වගා කිරීමට සුදුසු කාලයන් හඳුනා ගැනීම මෙම නියමු ව්‍යාපෘතියේ අරමුණය.

- මධ්‍යම පළාත
    - එළවළු සඳහා සැපයුම් සංවර්ධන වැඩසටහන් පවත්වා ඇත.
    - කුළුබඩු සඳහා GMP සහතික ලබාගැනීමට සහායවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.
    - පොලිතීන් වලින් සකසන ලද ආරක්ෂිත ගෘහ සැපයුම් සඳහා සහාය වීමේ වැඩසටහන් ද පවත්වා ඇති අතර සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් හා ව්‍යවසායකයන් සඳහා ඇසුරුම් තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණද පවත්වන ලදී.
    - අගය එකතු කල කුළුබඩු සංවර්ධන වැඩසටහන සහ කැපූ මල් හා ඕකිඩ් සැපයුම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.
- වයඹ පළාත
    - අපනයන වෙළෙඳපොල සඳහා විසිතුරු පැල වගාකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.
    - පුත්තලම දිස්ත්‍රික්කයේ මිරිස් වගාකිරීම සහ තත්ත්ව සහතික වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.
    - අපනයනකරුවන්, වක්‍ර අපනයනකරුවෝ හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සාර්ක් රටවල වෙළෙඳපොල අවස්ථා පිළිබඳ දැනුවත් කර ඇත.
- ඌව පළාත
    - බදුල්ල දිස්ක්කයේ GMP (සෞඛ්‍යාරක්ෂිත ක්‍රම) සහතික ලත් කුරුඳු සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීමට සහාය ලබා දී ඇත.
    - බදුල්ල දිස්ත්‍රික්කයේ වැල්දොඩම් වගාකරන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වා ඇත.
    - පොලිතින් වලින් සකස්කල ආරක්ෂිත ගෘහ තුල එළවළු වගාකිරීම සඳහා සහාය වීමේ වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.
    - ඇසුරුම්කරණය හා ප්‍රවාහන පද්ධති පිළිබඳ සම්මන්ත්‍රණයන් පවත්වන ලදී.
- උතුරු පළාත
    - වව්නියා දිස්ත්‍රික්කයේ කහ වගාව ප්‍රවර්ධනය කිරීමට කටයුතු කර ඇත.
    - ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා GPS කට්ටල ලබා දී ඇත.

### වෙළෙඳ තොරතුරු හා උපදේශන සේවා

අදාල කාලය තුල අන්තර්ජාලය හරහා ලෝක මිල ගණන් සෙවීම් 35 ක් සහ වෙළෙඳ දත්ත ලබාගැනීම් 170ක් පමණ ලබා දී ව්‍යවසායකයන් 853 කට පමණ පුස්තකාල සේවා ලබා දී ඇත.

### ඇසුරුම්කරණ වැඩසටහන්

ඇසුරුම්කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් 03 ක් පැවැත්වීමට කටයුතු කර ඇති අතර තායිලන්තයේ ඇසුරුම්කරණ මධ්‍යස්ථානයේ දී ශ්‍රී ලාංකීය ඇසුරුම්කරණ ද්‍රව්‍ය අලවිකරුවන් 12 ක් සඳහා පුහුණු වැඩ සටහනක් සංවිධානය කරන ලදී.

### නිපුණතා සංවර්ධන වැඩසටහන්

- කොළඹ, මාතර, නුවර, බදුල්ල සහ ගාල්ල යන ප්‍රදේශ වල ව්‍යවසායකයන් 1178 ක් සඳහා නිපුණතා සංවර්ධන වැඩසටහන් 23 ක් ක්‍රියාත්මක කර ඇත.
- ව්‍යවසායකයන් 227ක් සඳහා ආනයන අපනයන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවන් සහ අන්තර්ජාතික වෙළෙඳාමේ ක්‍රියා පිළිවෙල පිළිබඳ වැඩසටහන් 03 ක් ක්‍රියත්මක කර ඇත.

### අපනයන ආශ්‍රිත ප්‍රකාශන

"2002 – 2011 අපනයන ප්‍රගති දර්ශකය" සකස් කර ඇති අතර "Expo News" ප්‍රකාශන 24 අපනයන පුවත් 12 ප්‍රකාශයට පත් කර අපනයනකරුවන් අතර බෙදා දී ඇත

### විද්‍යුත් වාණිජ්‍ය සේවාවන්

- Tradenet SL විද්‍යුත් වාණිජ මධ්‍යස්ථානය මධ්‍යම හා වයඹ පළාත් කාර්යාල සඳහා ද ව්‍යාප්ත කිරීම කර ඇත.
- අදාල කාලය තුල නව සේවා ලාභීන් 78 වූ අතර මුළු සාමාජික සංඛ්‍යාව 1652 ක් දක්වා ඉහල නැංවුනි. නව ග්‍රාහකයින් 05ක් එක් වූ අතර මුළු ග්‍රාහකයේ සංඛ්‍යාව 62 ක් දක්වාඉහල නැංවින. අන්තර්ජාලය හරහා නව ගැණුම්කරුවන් සෙවීම් 278ක්, වෙබ් ප්‍රචාරණ 06ක්, වෙබ් අඩවි 07ක්, ඇමණීම් 06,වෙබ් තැපැල් 83ක් අපනයන ප්‍රජාව වෙත ලබාදී ඇත.

# අමාත්‍යාංශයේ

# පොදු තොරතුරු

# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ

## මානව සම්පත් ව්‍යුහය - 2012

| තනතුර | නිලධාරී සංඛ්‍යාව |
|---|---|
| ලේකම් | 01 |
| අතිරේක ලේකම් | 04 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 |
| ගණකාධිකාරී | 03 |
| අධ්‍යක්ෂ | 06 |
| සහකාර ලේකම් | 03 |
| සහකාර අධ්‍යක්ෂ | 17 |
| පරිපාලන නිලධාරී | 01 |
| භාෂා පරිවර්තක | 02 |
| පරිගණක වැඩ සටහන් සම්පාදක | 01 |
| ලේකම්ගේ සම්බන්ධීකරණ නිලධාරී (කොන්ත්‍රාත්) | 01 |
| කර්මාන්ත පරීක්ෂක | 13 |
| තොරතුරු හා සන්නිවේදන තාකෂණ නිලධාරී | 01 |
| කර්මාන්ත සංවර්ධන සහකාර | 41 |
| ප්‍රවෘත්ති නිලධාරී | 01 |
| ගිණුම් සහකාර | 01 |
| ප්‍රසම්පාදන සහකාර | 01 |
| සංවර්ධන සහකාර | 04 |
| කළමනාකරණ සහකාර | 70 |
| තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර | 01 |
| දත්ත සටහන් ක්‍රියාකරු | 02 |
| විඩියෝ කැමරා ශිල්පී | 01 |
| නිශ්චල ඡායාරූප ශිල්පී | 01 |
| කැමරා ක්‍රියාකරු සහායක | 01 |
| පිළිගැනීමේ නිලධාරී | 01 |
| පුද්ගලික ආරක්ෂක නිලධාරී | 05 |
| රියදුරු | 36 (අනියම් 01) |
| කාර්යාල කාර්ය සහායක | 57 |

# දේශීය පුහුණු - 2012

| | පාඨමාලාවේ නම | ආයතනය | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | සහතිකපත්‍ර පාඨමාලාව ඉංග්‍රීසි- අන්තර්මාධ්‍ය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 06 |
| 02 | සහතිකපත්‍ර පාඨමාලාව ඉංග්‍රීසි- ප්‍රාථමික අදියර | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| 03 | ඉංග්‍රීසි (උසස්) ඩිප්ලෝමාව | කොළඹ විශ්ව විද්‍යාලය | 01 |
| 04 | ගබඩා කළමණාකරණය හා සැපයුම් කළමණාකරණය | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 01 |
| 05 | විෂ විද්‍යාව පිළිබඳ සම්මන්ත්‍රණ | ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය | 02 |
| 06 | යහපාලනය හා නායකත්වය පිළිබඳ වැඩමුළුව | ශ්‍රී ලංකා පදනම් ආයතනය | 02 |
| 07 | පශ්චාත් උපාධිය (ආර්ථික විද්‍යාව) | කැළණිය විශ්ව විද්‍යාලය | 02 |
| 08 | පුණර්ජනන බලශක්ති ප්‍රභව පුහුණු වැඩසටහන | ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය | 02 |
| 09 | අන්තර්ජාතික සහයෝගීතාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | ජාත්‍යන්තර අධ්‍යාපනය පිළිබඳ මධ්‍යස්ථානය (BCIS) | 01 |

# විදේශීය පුහුණු - 2012

| | Country | Programme | No of Officers |
|---|---|---|---|
| 01 | Australia | Master of International Development and Master of Commerce | 01 |
| 02 | Korea | Masters Degree Programme in Development Policy | 01 |
| 03 | India | Innovative Leadership for Organization Growth & Excellence | 01 |
| 04 | Singapore | Regional workshop on the GATS | 01 |
| 05 | China | Vice- Ministerial Seminar for Entry Exit Commodity Inspection Officials of Developing Countries | 01 |
| 06 | China | Seminar on Trade & Investment | 02 |
| 07 | China | Professional Programme for Diplomats | 01 |
| 08 | China | Seminar on Low Carbon Industries & climate Change | 02 |
| 09 | Korea | Group Training on SL Economy | 01 |
| 10 | Japan | GTC: financial Support | 01 |
| 11 | China | Master of international Communication | 01 |
| 12 | India | Training Programme on Entrepreneurship & Small Business Promotion | 01 |
| 13 | China | Technical Workshop on Climate Change & Green Asia | 01 |
| 14 | India | 3rd training on Leadership Development for Senior Officials | 01 |
| 15 | The Netherlands | Basic Course for personnel of National Authorities involved in the implementation of the CWC | 02 |
| 16 | Malaysia | Seminar on the CWC and Chemical Safety and Security Management | 01 |
| 17 | Thailand | Second Country Study visit of Master of Public Management Programme | 01 |
| 18 | Finland | 16th Training on NA & Chemical Database | 01 |
| 19 | China | Workshop Article XI of the CWC | 02 |

# මූල්‍ය ප්‍රගතිය

# ශීර්ෂ 149 - කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
## පුනරාවර්තන වියදම - 2012 දෙසැම්බර් 31 දක්වා

| වැඩසටහන සහ ව්‍යාපෘතිය | අයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම රු. | ශේෂය රු. | උපයෝජනය % |
|---|---|---|---|---|---|
| | | | | | |
| **01 මෙහෙයුම් වැඩසටහන්** | | | | | |
| **01. අමාත්‍ය කාර්යාලය** | පුද්ගල පඩිනඩි | 17,660,000 | 15,873,985 | 1,786,015 | 89.89% |
| | ගමන් වියදම් | 7,720,000 | 7,329,481 | 390,519 | 94.94% |
| | සැපයීම් | 12,130,000 | 11,925,857 | 204,143 | 98.32% |
| | නඩත්තු වියදම් | 6,470,000 | 6,122,044 | 347,956 | 94.62% |
| | ගිවිසුම්ගත සේවා | 12,390,000 | 8,600,545 | 3,789,455 | 69.42% |
| | මාරුකිරීම් | 10,000 | 0 | 10,000 | 0.00% |
| | **උප එකතුව** | **56,380,000** | **49,851,912** | **6,528,088** | **88.42%** |
| | | | | | |
| **02. පරිපාලනය හා ආයතනික සේවා** | පුද්ගල පඩිනඩි | 54,250,000 | 45,898,173 | 8,351,827 | 84.60% |
| | ගමන් වියදම් | 3,875,000 | 3,432,421 | 442,579 | 88.58% |
| | සැපයීම් | 9,149,000 | 7,074,465 | 2,074,535 | 77.33% |
| | නඩත්තු වියදම් | 5,985,000 | 5,139,705 | 845,295 | 85.88% |
| | ගිවිසුම්ගත සේවා | 34,665,000 | 25,263,777 | 9,401,223 | 72.88% |
| | මාරු කිරීම් | 6,071,000 | 5,565,107 | 505,893 | 91.67% |
| | **උප එකතුව** | **113,995,000** | **92,373,648** | **21,621,352** | **81.03%** |
| | | | | | |
| | **එකතුව - මෙහෙයුම් වැඩසටහන** | **170,375,000** | **142,225,560** | **28,149,440** | **83.48%** |
| | | | | | |
| **02. සංවර්ධන වැඩසටහන** | | | | | |
| **03. කාර්මික සංවර්ධනය** | පුද්ගල පඩිනඩි | 59,230,000 | 50,294,455 | 8,935,545 | 84.91% |
| | ගමන් වියදම් | 3,150,000 | 2,705,761 | 444,239 | 85.90% |
| | සැපයීම් | 3,925,000 | 3,434,975 | 490,025 | 87.52% |
| | නඩත්තු වියදම් | 3,055,000 | 2,289,852 | 765,148 | 74.95% |
| | ගිවිසුම්ගත සේවා | 13,445,000 | 8,713,242 | 4,731,758 | 64.81% |
| | වෙනත් පුනරාවර්තන වියදම් | 1,320,000 | 1,314,985 | 5,015 | 99.62% |
| | **උප එකතුව** | **84,125,000** | **68,753,270** | **15,371,730** | **81.73%** |
| | | | | | |
| | ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය | 10,000,000 | 0 | 10,000,000 | 0.00% |
| | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 23,000,000 | 20,075,000 | 2,925,000 | 87.28% |
| | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය | 265,000,000 | 246,130,000 | 18,870,000 | 92.88% |
| | **උප එකතුව** | **298,000,000** | **266,205,000** | **31,795,000** | **89.33%** |
| | | | | | |
| | **එකතුව - සංවර්ධන වැඩසටහන** | **382,125,000** | **334,958,270** | **47,166,730** | **87.66%** |
| | **එකතුව- පුනරාවර්තන වියදම්** | **552,500,000** | **477,183,830** | **75,316,170** | **86.37%** |
| | | | | | |

# ප්‍රාග්ධන වියදම - 2012 දෙසැම්බර් 31 දක්වා

| වැඩසටහන සහ ව්‍යාපෘතිය | අයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම රු. | ශේෂය රු. | උපයෝජනය % |
|---|---|---|---|---|---|
| | | | | | |
| **01 මෙහෙයුම් වැඩසටහන්** | | | | | |
| **01.** අමාත්‍ය කාර්යාලය | මූලධන වත්කම් වල පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීම | 7,500,000 | 6,439,509 | 1,060,491 | 85.86% |
| | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | 17,570,000 | 17,297,344 | 272,656 | 98.45% |
| | | | | | |
| | **උප එකතුව** | **25,070,000** | **23,736,853** | **1,333,147** | **94.68%** |
| | | | | | |
| **02.** සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා | මූලධන වත්කම් වල පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීම | 6,910,000 | 6,264,655 | 645,345 | 90.66% |
| | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | 1,390,000 | 1,360,308 | 29,692 | 97.86% |
| | පුහුණු සහ හැකියා වර්ධනය | 1,000,000 | 414,397 | 585,603 | 41.44% |
| | | | | | |
| | **උප එකතුව** | **9,300,000** | **8,039,360** | **1,260,640** | **86.44%** |
| | | | | | |
| | **එකතුව - මෙහෙයුම් වැඩසටහන** | **34,370,000** | **31,776,213** | **2,593,787** | **92.45%** |
| | | | | | |
| **02.** සංවර්ධන වැඩසටහන | | | | | |
| **03.** කාර්මික සංවර්ධන වැඩසටහන් | මූලධන වත්කම් වල පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීම | 5,300,000 | 1,890,740 | 3,409,260 | 35.67% |
| | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | 2,300,000 | 540,377 | 1,759,623 | 23.49% |
| | පුහුණු සහ හැකියා වර්ධනය | 1,000,000 | 128,275 | 871,725 | 12.83% |
| | | | | | |
| | **උප එකතුව** | **8,600,000** | **2,559,392** | **6,040,608** | **29.76%** |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන | 275,000,000 | 144,224,737 | 130,775,263 | 52.45% |
| | ආංශික සංවර්ධන වැඩසටහන | 225,000,000 | 22,370,752 | 202,629,248 | 9.94% |
| | *පාවහන් නිෂ්පාදන පුහුණු පාසල | 35,000,000 | 0 | 35,000,000 | 0.00% |
| | * සම් හා සම් භාණ්ඩ ආශ්‍රිත කර්මාන්ත ව්‍යාපෘතිය | 41,980,000 | 0 | 41,980,000 | 0.00% |
| | * ඖෂධ නිෂ්පාදන කර්මාන්තය සඳහා වූ විශ්ලේෂණාත්මක විද්‍යාගාරය | 20,000,000 | 0 | 20,000,000 | 0.00% |
| | * විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය සඳහා තාක්ෂණික පෙරවැඩුම් මධ්‍යස්ථානය | 7,000,000 | 0 | 7,000,000 | 0.00% |
| | * කර්මාන්ත අපද්‍රව්‍ය කළමනාකරණය හා අපද්‍රව්‍ය හුවමාරු වැඩසටහන | 7,000,000 | 0 | 7,000,000 | 0.00% |
| | * කොන්ක්‍රීට් සහ සිමෙන්ති පාදක නිෂ්පාදන වර්ධනය කිරීම | 6,400,000 | 0 | 6,400,000 | 0.00% |
| | * අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති | 42,000,000 | 18,604,828 | 23,395,172 | 44.30% |
| | * දැයට කිරුළ ප්‍රදර්ශනය | 8,000,000 | 3,765,924 | 4,234,076 | 47.07% |
| | අත්යන්ත්‍ර සහ ඇඟළුම් කර්මාන්තය | 104,000,000 | 41,276,542 | 62,723,458 | 39.69% |
| | පරිසර හිතකාමී විසඳුම් ව්‍යාපාතිය | 5,200,000 | 4,053,038 | 1,146,962 | 77.94% |
| | මන්නාරම් ලුණු ලේවා ව්‍යාපෘතිය | 5,000,000 | 4,956,620 | 43,380 | 99.13% |
| | **උප එකතුව - කාර්මික සංවර්ධන වැඩසටහන්** | **614,200,000** | **216,881,690** | **397,318,310** | **35.31%** |
| | **එකතුව - සංවර්ධන වැඩසටහන** | **622,800,000** | **219,441,082** | **403,358,918** | **35.23%** |
| | **එකතුව - මෙහෙයුම් වැඩසටහන් සහ සංවර්ධන වැඩසටහන්** | **657,170,000** | **251,217,295** | **405,952,705** | **38.23%** |

| වැඩසටහන සහ ව්‍යාපෘතිය | අයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම රු. | ශේෂය රු. | උපයෝජනය % |
|---|---|---|---|---|---|
| | | | | | |
| 05. රාජ්‍ය ආයතන | | | | | |
| **01. අමාත්‍ය කාර්යාලය** | ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය | 28,600,000 | 14,737,000 | 13,863,000 | 51.53% |
| | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 30,000,000 | 15,325,000 | 14,675,000 | 51.08% |
| | ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 515,000,000 | 186,679,000 | 328,321,000 | 36.25% |
| | **උප එකතුව** | **573,600,000** | **216,741,000** | **356,859,000** | **37.79%** |
| | | | | | |
| | | | | | |
| | **එකතුව - ප්‍රාග්ධන වියදම්** | | | | |
| | **(මෙහෙයුම් වැඩසටහන්, සංවර්ධන වැඩසටහන් සහ රාජ්‍ය ආයතන)** | **1,230,770,000** | **467,958,295** | **762,811,705** | **38.02%** |
| | | | | | |
| | **මුළු එකතුව (ප්‍රාග්ධන වියදම් සහ පුනරාවර්තන වියදම්)** | **1,783,270,000** | **945,142,125** | **838,127,875** | **53.00%** |